

a novel
by Minuli Ekanayake
The breath

# හුස්ම ( THE BREATH)

- මිනුලි විහන්සා ඒකනායක -

කතෘ

<u>- පළමු දිගහැරුම-</u>

- තක්ෂිලා මධ්‍ය විද්‍යාලය හොරණ
- 11 ශ්‍රේණිය
- 2025/02/08

ISBN 978-624-208-760-3

# පිදුම

මම සමඟ මට ශක්තියක් ව එදත්

අදත් සිටි මාගේ පවුලේ සැමට සහ

ආදරණීය හදවත් හිමි ඔබට මේ

" හුස්ම" ලෙන්ගතුව පුදන්නෙමි....!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

ඇද හැලෙන මහා වර්ෂාවට කොළඹ අහස ගත්තේ නොසන්සුන් ස්වභාවයකි.දැල් සහිත ජනේලයෙන් එපිට සිදුවන ජල තරඟය දෙස මම බලා සිටියේ හිස් මනසකින් ය.

"ශා බං වහිනවා නේද මේ වෙලාවට උණු උණුවෙන් රොටියක් වගේ කන්න තිබ්බනම් නයි මිරිසක් එක්ක මරු" තරූ තම තෙත කොන්ඩය පීරමින් ම පවසුවා ය.

"හ්ම් ඉතිං ඇයි අපි යන්නේ නැත්තේ අර සීයාගේ කඩේ ට" මොනවා නැතත් තරූ මගේ  බඩගින්නද උත්තේජනය කළාය.

" හෑ මේ උඹමද? ... හිටහන් සුටුස් ගාලා එන්නම් " තරූ ක්ෂණික ව ඇඳුමක් දා ගත්තේ ඇගේ ආසාවේ තරම පෙන්වමිනි.

අපේ බෝඩිමට මීටර පහ හයකින් එහාට වෙන්න පිහිටි පුංචි පෙට්ටි කඩයෙන් තරූත් මාත් කෙටි ආහාර අපේ තේ වෙලාවට රැගෙන යාමට පුරුදු වී සිටියෙමු. සතියේ දිනයන් හී එය විශ්වවිද්‍යාලීය  සිසුන්ගේ සුපුරුදු නවාතැන්පලයි. මද වේලාවකට පසු තරූත් මාත් කඩයට ළඟා විය.

" සීයේ අපිට දාන්නකෝ උණු උණුවෙන් රොටි 4ක් , පාර්සල් කරලම දෙන්න . ආහ් සීයගෙ ස්පෙෂල් නයි මිරිස් පැකට් එකත් ඕනේ" මම පැවසුවේ එක හුස්මට ය.

සීයාත් සුන්දර සිනහවකින් මා දෙස බැලුවේ ය.

කඩයෙහි පැත්තක තිබූ රේඩියෝව පැරණි ගීතයක් මවයි.මම සීතලේම එයට සවන් දුන්නෙමි.මේ නොනවතින

වරුසාවේ සීරුවේ ම තරමක වයස ජෝඩුවක් කඩයටපිවිසියේ තනි කුඩයකින් ය.ඔවුන් තම ඇණවුම සීයාට ලබා දී අසල තිබෙන කුඩා කොටය මත වාඩි විය. මඳ වේලාවකට පසුව කඩේ සීයා ඔවුන්ට තේ කෝප්පයක් පිරි නැංවී ය.

" ආං බලපන් මන්දු අර සීයා  අර ආච්චිට  තේක පොවනවා...දැකලා නැත්තං බලාගනින් ඕකට කියන්නෙ නාකි ලව් කියලා " තරූ එසේ පැවසුවද මට ඔවුන් කෙරෙහි ඇති වූයේ වෙනස්ම හැඟීමක්.

ජීවිතයේ අපට ආදර හැඟීමක් ඇති වන්නේ එක් වතාවක් පමණී .දෙවනවරට එය පැන නැගුනොත් එහි ශේෂව ඇත්තේ ආසාව පමණී. තමන්ගේ හොඳම ආදරය එය හට ගත් දිනයේ ඇති වූ හැඟීම් සමඟ තමාගේ ජීවිතයේ අවසන් හුස්ම තෙක් ආරක්ෂා කිරීම ලෙහෙසි දෙයක් නොවේ . ඉතින්  ආසාවට ආදරය කරන පෙම්වතුන් අතරේ ගැඹුරු හදවතින් ආදරය කරන මේ සීයාත් ආච්චිත් ඔවුන් ට ආදර්ශයකි.

අසල තිබූ කණුවකට බර වී මම මගේම ලෝකයක සැරිසැරුවේ එම ආදරණීය යුවල දෙස දෑස් යොමා ගෙනය.

වෙව්ලන දෑතින් තේක රසවිඳිමින් සිටි ඔවුන් ආදරණීය කතාවක.....
(ජටාස්....)

තේ කෝප්පය ඔවුන් අතෙන් ගිලිහුණේ ක්ෂණයෙනි.එම වයෝවෘධ යුවලට උපකාර කිරීමේ අදහසින් මම පෙරට විය.

" කෝ ඉන්න සීයේ මං උදව් කරන්නම්.මාමේ අපිට තව තේකක් දාන්න ... ඔන්න දැන් හරි.. ආහ් මෙන්න සීයේ ආච්චිට මේ මල දෙන්න"

සීයා ඒ පිච්ච මල ආච්චිගේ කන පිටුපස රදවා එම රැලි වැටුණු නළලත සිප ගත්තේ ය.යුවල සිනාසුනේ ලැජ්ජාවෙනි.

නමුත් ඒ මම නොවේ. එසේ නම් මේ හාදයා කවුරුන්ද ? මේ යුවලට උපකාර කල හාදයා කවුද?..රැලි වැටුණු දිගු කෙස් ගස් , මනාව මැඩගත් දේහදාරී සිරුර , කාන්දමකට සමාන ඒ සිනහව මට ඔහු කෙරෙහි ඇති වූ කුතුහලය දියුණු කලේ ය. මගේ ඇස් කෝණ කිහිපයකට කැරකුවද මං අසාර්ථක වූයේ ඒ ප්‍රියකරු ජීවියාගේ මුහුණ මට හරියටම නොපෙනීම හේතුවෙනි. ඔව් ඔහු මා දෙස බැලුවේ ය.

"මන්දු එන්න බස් එක ආවා.." කරුමය තරූ ලෙසද පැමිණිය හැකි බව මට වැටහුණේ එවිටය.මට ඔහු මඟ ඇරුණිද? "අනේ එකම එක පාරක්" මම මගෙ සිතිවිලි සමඟ පොර බැන්දෙ ඔහුගේ රුව දැක ගැනීමට නොහැකි නිසාවෙන් ද?

බස් රථයේ ජනේල් කෙළවර අසුනෙහි හිඳ ගත් මා නොසන්සුන් ව සෙව්වේ ඒ නීල සදැස් ය.

ඔව්. මා ඔහු දුටුවා .ඒ නීල සදැස් මා වෙතය. කේසර පිරුණු ඒ වත මට ලොල් ය.ඝනකම ඇහිබැම ඔහුට පෑවේ අසාමාන්‍ය කඩවසම් බවකි.

මගේ හදවතෙහි ගැස්ම මෙතරම් නොසන්සුන් ඇයි,. මගේ ඇස් ඒ වත පමණක් දකින්නේ ඇයි. එහෙනම් මේ එයද..

හදවතට දැනෙන හුස්මක් වටින ආදරයද මේ........

නුපුරුදු හැඟීමක් මගේ හිතට ලබා දී බස් රථය නික්මුණි.

අවුරුදු 4කට පසු .......

" i am a disco dancer,ඕ ඕ යෙහ් යෙහ් .. කැරකිලා ශා .."
මොනාද මන්දූ මේ විකාර.. බලනවා කෙල්ලෙක් ගේ
කාමරේක හැටි ..."

"අනේ ඔලමොට්ටල බූරු හරක් හිකනල් පොල් බෑ මූණු මල්
ඇටි කුකුලෝ..එන්නෙපා හරිත..මගේ කාමරේට එක එක
ඒවා කියෝගෙන , දන්නවනේ මේ මන්දුගේ හැටි ..හ්ම්.

මන්දෝදරී තිසාක්‍යා සළුවඩන.අවුරුදු 22 පුංචි කෙල්ලක් .
වෘත්තීයෙන් වෙන්න දොස්තරවරියක්.ඒ කියන්නේ කොළඹ
විශ්වවිද්‍යාලයේ තම උපාධිය හදරන ශිෂ්‍යයාවක්.

"තමන්ගේ අයියා කියලවත් ගරු නොකර මේකි
කතා කරන හැටි විතරක්." .......
"ලොකු ..එන්න කන්න බත් බෙදලා තියෙන්නෙ..චූටී
එන්නකෝ පුතේ...කෝ මෙයාලා, ආහ් මේ ඉන්නේ ඩබල
මොකො මේ දෙන්නා නිකන් 2වන ලෝක යුද්ධෙ වගේ."
රෝශිනීත් මන්දුගේ කාමරයට ආවාය.

මන්දුල් තිසාක්‍ය සළුවඩන එහෙම නැත්තන් මන්දුගේ අයියා
.. මන්දුට අනුව බැදලා ළමයි 2ක් වත් ඉන්න ඕනේ වයසේ
කොල්ලෙක්.. එත් තවම ඔහුට අවුරුදු 31යි.

" අනේ අම්මා බලන්නකෝ මේ බූරුවා මට ඉන්න දෙන්නේ නෑ"

"අනේ අම්මේ මේ මට වැඩේමනේ.." " හරි හරි දැන් ඔය රණ්ඩු උනා ඇති මොනවාද අනේ තාම පොඩි උන් වගේ දෙන්නත් එක්ක.. හා හා එන්න පහලට කෑම ලෑස්තියි .!"
රෝශිනී පහළට යන්න තරප්පු පෙළ බහිද්දිම මන්දු ලොකුට දිව දික් කලේ හරියට නිකන් ලොකු ජයග්‍රහණයක් ලැබුවා වගේ. ලොකුත් බේගල් තරහවක් පෙන්නා පසුව තමාට ම හිනා වුණේය.

"අපේ මහත්තයා තව ටිකක් බෙදා ගන්නකෝ."
"නැ නැ ඇති රෝශි.. "වසන්ත මේසෙන් නැගිටලා අතත් හෝදගෙන කෙසෙල් ගෙඩියේ ලෙලි අරිමින් මන්දු දිහා බැලුවේ ය...." ඒක නෙමෙ රෝශි මං මේ බැලුවේ මන්දුටත් කැම්පස් නිවාඩු හින්දා ලොකුත් මේ දවස් වල ගෙදරත් නිසා කොහේ හරි ගිහින් එන්න.පොඩි වෙනසකට ".

"ඈහ් මේ අපේ අප්පච්චිමද???" මන්දුගේ ඇස් තිබුනේ නලළේ. වසන්තත් මන්දු දෙස බලා හිනාවුනේ ය.
" හ්ම්. ඒකනම් හොඳයි මහත්තයා කාලෙකින් කොහේවත් යන්නත් බැරි වුනානේ." රෝශිනීත් එසේ කැමැත්ත ප්‍රකාශ කලා ය."

"අප්පච්චි බදුල්ල පැත්ත වගේ හොඳයි නේද?" ලොකු අදහස දැම්මේ එවිට ඔහුගේ පෙම්වතිය ශෙනායාවත් ගමනට එකතු කර ගත හැකි බව පෙන්වා දීමට මෙනි. "

" එහෙනම් අපි බදුල්ලේ යමු . ආහ් ශෙනායා දූටත් අපිත්

එක්ක යන්න පුලුවන් නේද "

"ඔව් අප්පච්චි මං කියන්නම්" ලොකුගේ සතුට හදවතට සීමා වූයේ කෑම මේසේ උඩ පනින්න බැරි නිසාවෙනි.

" අප්පච්චි මාත් එහෙනම් තරුෑට එන්න කියන්නද?" මන්දු එසේ පැවසූ යේ තමන්ගේ යෙහෙළිය ද ගමනට එකතු කර ගැනීමේ අදහසිනි.

"හා පුතේ , හැබැයි තරුෑගේ අම්මව දැනුවත් කරන්න වෙයි" වසන්ත පැවසුවේ වගකීම් සහගතවය.

"හරි අප්පච්චි " මන්දු පැවසුවේ මද සිනාවක් මුහුනේ රදවාගෙනයි.

සතියකට පමණ සිට නිවසේ සියල්ලන්ම ගමනට සූදානම් වූයේ සතුටිනි.

"අනේ අප්පච්චි මේ ලොකු මට කැත මැස්සි කියලා කිව්වා" ගමන යෑමට සූදානම් ව උදෑසනම මන්දුගේත් ලොකුගේත් සුපුරුදු අඩදබර ක්‍රියාත්මක වී තිබුණි.

"මොකද ලමයි මේ උදේ පාන්දර ම පටන් අරගෙන"රෝශිනිත් බොරු අමනාපයක් පෙන්වමින් රෙදි මලු සියල්ල වසන්ත වෙත පෑවාය.
"හා හා එහෙනම් යමු යමු තව පරක්කු වෙන්න බෑ"වසන්ත කීවේ අත් ඔරලෝසුව දෙස බලමිනි.

"ගුඩ් මෝර්නින් හැමෝටම " ශෙනායාත් දසන් දක්වා

සිනාසෙමින් වසන්තටත් රෝශිනීටත් වැන්දාය.

"කොහොමද පුතේ" රෝශිනී ශෙනායාගෙ ඔළුව අත ගා හිස සිඹියේය.

ශෙනායා වෘත්තීයෙන් වෛද්‍යවරියක්.ලොකු එවිටම ගෙතුලින් පිටත සිටි ශෙනායා දෙස බලා සෙනෙහෙවන්ත සිනාවක් පෑවේය.

"මෙතන ඉදන් පැණි හලන්නේ නැතිව යනවා ගිහින් ඉඹලාවත් එනවා" මන්දු එසේ පවසමින් ම කෙසෙල් ගෙඩියකට වග කීවාය.

"එනකම් බලන් හිටියේ" ලොකු එසේ පවසමින් ශෙනායගේ නලලත සිඹියේය.

"ඔන්න අක්කේ දැන් තමා අපේ අයියාට සිහිය ආවේ." මන්දු ශෙනායව වැලද ගෙනම කේලම පැවසුවාය.

"කට්ටිය දැන්වත් එළියට බහිමුද නැත්තං ඉතිං යන්න වෙන්නේ නෑ දන්නවනේ ට්‍රැෆික් එක"වසන්තත් KDH වර්ගයේ වෑන් රථයට නගිමින් ම පැවසුවේ ය.

"අනේ දෙයියන්ගේ පිහිටෙන් හැමෝම ආරක්ෂා වෙන්න ඕනේ".රෝශිනීත් එසේ පවසමින් ම වාහනයට ගොඩ වුණි.

"ඕන් එහෙනම් අපි යන්නයි යන්නේ හුරේ" මන්දු සතුටින් කෑ ගැසුවාය.

වාහනයේ නැගී සියලු දෙනාම ගමන පිටත් වුණි.අතරමගින් තරු වත් රථයට නංවා ගැනීමෙන් පසු තරුත් මන්දුත් හරි හරිටය කතා කරමින් ආගිය තොරතුරු විමසමින් ගමන් කලෝ ය.තරු මන්දුගේ කුඩා කල සිට මිතුරියකි.එබැවින් ඔවුන් කවදා හමුවුවද ඔවුන්ට බෙදා ගැනීමට බොහෝ දෑ ඇත.වසන්තත් රෝශිනිත් ඉදිරිපස අසුනෙහි සිට බර කතාවකි.ලොකුත් ශෙනායා සමග ආදරණීය කතාවකි. ලොකුගේත් ශෙනායාගේත් ආදර සම්බන්ධතාවයට අවුරුදු 7ට ආසන්නය.

"මන්දු මේ දන්නවද වැඩක් අපේ මාමා  ඉන්නවා බදුල්ලේ අපි යන තැනට ටිකක් එහායින්.අම්මි කිව්වා මේ පාර්සල් එක එයාට දෙන්න කියලා.ඔයාට පුලුවන්ද මාත්
එක්ක මේක එයාට දෙන්න එන්න" තරූ බැගෑපත්ව මෙන් ඉල්ලුවා ය.

"ශා මරුනේ එහෙනම් අපි අද හවස අයියාත් එක්ක එහෙ යමු.වටයක් දාලා එන්නත් පුලුවන්" මන්දුගේ යෝජනාවට තරූ එකග වුණි.

"මොනාද මොනාද මේ දෙන්නා මගේ මන්දුල් එක්ක කරන්න යන්නෙ " ශෙනයා ව්‍යාජ තරහවකින් මන්දුගෙන් විමසී ය.

"ආහ් තරූ මට අමතක වුනානේ අපේ ලොක්කටත් දැන් අයිතිකාරයෝ ඉන්නව කියලා "මන්දුත් සිනහ වෙන්ම පැවසී ය.

ඉදිරිපස අසුනේ සිට වසන්තත් රෝශිනීත් එකවර සිනාසෙනු මන්දු දුටුවේ එවිටය .

" අනේ සොරි වෙන්න ඕනේ අක්කේ ඔයා එහෙනම් ඔයාගේ මන්දුල් බබාව තියාගෙන තව ඉඹින්නකෝ"මන්දුත් ඇගට පතට නොදැනීම කීවාය.

ශෙනායා රක්ත වර්ණයට හැරුණි.වසන්තත් රෝශිනීත් පිටුපස නොබලාම මන්දුගේ කතාවට සවන් දීගෙන සිටියෝය.

"ඒයි මන්දු මොනාද මේ කියවන්නේ,අප්පච්චිලාත් ඉන්නවා"ලොකුත් රතු වී ඇති බව මන්දු දුටුවේ එවිටය .

"ආහ් දැන් කරන්න හොඳයි.කියන්න බෑ"මන්දු එය කීවේ ලොකුටත් ශෙනායටත් පමණක් ඇසෙන පරිද්දෙනි.

"ඒක නෙමේ නංගි කොහොමද කැම්පස් එකේ වැඩ " ශෙනායා එය ඇසුවේ කතාව වෙන පැත්තකට ගෙන යාමේ අදහසිනි .

" හොඳයි අක්කේ.හිතපු තරම් ලේසි නෑ, ඒත් හරිම සුන්දරයි." මන්දු එය නම් පැවසුවේ හදවතට එකගවමය.

මන්දු කවදාත් ප්‍රිය කලේ මිනිසුන්ගේ දුක නිවීමටය.එයට වඩාත් සුදුසු මාර්ගයක් ලෙස මන්දු තෝරා ගත්තේ වෛද්‍ය වෘත්තීයයී.

"එහෙම තමා නංගි පස්සේ හරියයි.මට සතුටුයි ඔයා ඉන්න විදියට "ශෙනායා එය පැවසුවේ සැබෑම සහෝදරියක ලෙසිනි.

මන්දු ඇයට තුරුලු වූයේ ඒ බව ඇයටද දැනුනු නිසාවෙනි.

දහවල් 12 පමණ වන විට ඔවුන් නවාතැනට පැමිණ තිබුණි.එය කදුකරයේ පිහිටි නව මාදිලියේ හෝටලයක් විය. ගමන් මහන්සියත් සමග එය මදක් දහවල් වේලාවක් වූ හෙයින් එහි පැමිණෙන විටද මන්දු සිටියේ අඩ නින්දෙනි.පසුව ඇයව වෙන් කරවා ගත් කාමරයට රැගෙන විත් නිදි කරවූයේ තරූ විසිනි.

හවස 3ට පමණ නින්දෙන් අවදි වන විට ඇයගේ දකුණු පස සිටින තරූ දැක මන්දු හෙලුවේ අනුකම්පා සහගත බැල්මකි.ඇය නැගිට පොරවනයෙන් තරූව වසනවාත් සමග ශෙනායා දොර ඉදිරියේ පෙනී සිටියා ය.

"මං ඒත් බැලුවා තාම කෙල්ල නිදිද කියලා "ශෙනායා ඇසුවේ මන්දුගේ අතකින් අල්ලා ගෙනය.

"නෑ අක්කේ දැනුයි නැගිට්ටේ අර හෝන්තුව නම් තාම නිදි.මං ටික් ගාලා වොශ් එකක් දාගෙන එන්නම්" මන්දු එසේ පවසා නානකාමරයට වැදුණි .

ඇයගේ නා දල්ල වැනි සුසිනිදු ලවන් පටල , කිරි පැහයෙන් දිලෙන සමේ වර්ණය දෙස ඇය මදක් නානකාමරයේ කැඩපතින් බලා සිටියා ය.

බදුල්ලේ සීතල පොළොව ඇයව කූල්මත් කරනවා වැනි හැගීමක් හිතට දැනුනිද විඩාව නිවා ගැනීමට ඇය සීතල වතුර කාරාමයම භාවිත කලා ය. හිම කැට වන් ජලය ඇගේ නිරුවත් ශරීරය සිප ගද්දී ඇය ඇගේම ලොවක තනි වුවා ය.

මද වේලාවකට පසු මන්දු තම තුවායත් ඇද කාමරයට

පිවිසියා ය.ඉදිරිපසට මුහුණලා සිටි තරූ දැක මන්දුට සතුටක් ඇති විය.පිටුපසින් ගොස් ඇයව වැලඳ ගත්තද මන්දුගේ තුවාය බිමට පතිත වෙන්න වැඩි වේලාවක් ගත වූයේ නැත.

"ආහ් හරි ශෝක් කෙල්ලෝ දෙන්නා මන්දු ඕක ඉක්මනට ඇඳ ගන්න දැන් අයියත් එයි."ශෙනායා එය පැවසුවේ සිනහවෙන්මය.

"අයියෝ ඕක මොකක්ද ඌ දැකලා තියේ.නැද්ද බං.අප්පටසිරි අලුත් නෑනා දැකලා නෑනේ."මන්දු ක්ෂණිකව ක්‍රියාත්මක වී තුවාය ඇඳ ගත්තා ය.

"අනේ මන්දා බං උඹ නං" තරූත් සිනහවෙන්ම ඇයට පැවසුවා ය.

"ශෙනායා ඔයා කොහෙද ?" ඈතින් ලොකුගේ කටහඬ ඇසෙත්ම තිදෙනාම තිගැස්සී එදෙස බැලූහ.

"ආං ඔබතුමීගේ සත්‍ය ප්‍රේමබෘංග රාජයා අමතවා"මන්දු විහිලුවක ස්වරූපයෙන් පැවසුවා ය.

"ආහ් මේ ඉන්නේ මොකෝ මෙයා ටවල් එක පිටින් ෆැෂන් ෂෝ ද?" ලොකුත් මන්දුගේ විහිලුවට නොදෙවෙනි ව පැවසුවේ ය.

"හ්ම් තව ටිකකට කලින් එන්න තිබ්බේ"ශෙනායත් එම විහිලුවට එකතු විය.

"ම්ම් මට හිතා ගන්න පුලුවන් , ආහ් මේ එක නෙමේ ඔයා මගේ චාජර් එක කොහෙද තිබ්බේ මට හොයලා දෙන්නකෝ."

ලොකු එය පැවසුවේ කුඩා දරුවෙකු ලෙසිනි .

"ඇයි ඒක අර මේසේ උඩ තිබ්බේ" ශෙනායා පැවසුවේ තරවටු ස්වරයෙනි.

"ඒක එතන නෑ අනේ ඔයා එන්නකෝ හොයලා දෙන්න.ආහ් මන්දු ඔයත් ඇදුමක් දාගෙන එන්න පහළට කෑම කන්න"ලොකු එසේ පවසමින් ම ශෙනායාවත් ඇදගෙන පිටත් විය.

"ආහ් මන්දු අපි අයියාට කිව්වේ නෑනේ මාමලගේ ගෙදර යන්න ඕන කියලා "

"ඕන නෑ තරූ මේ ලගනේ අපි දෙන්නා යං.අනිත් ඒක එයා ඔය ශෙනායා අක්කවත් ඇදගෙන ගියේ චාජරේ හොයන්න නෙමේ" මන්දුගේ කපටි සිනහව තරූට වැටහුනේ නැත.

"එහෙනම්"

" පොඩ්ඩක් තනියෙන් කතා කරන්න, ඒ දෙන්නට කරදර කරන්න ඕන නෑ අපි යමු.මොනා උනත් පව්නේ බං අපේ ලොකුත් " එසේ පවසමින් දෙදෙනා ම සූදානම් වූයේ දහවල් ආහාරය සඳහා ය.

පවුලේ සියලු දෙනාම ආගිය තොරතුරු පිළිබඳ කතා කරමින් සීරුවෙන් දහවල් ආහාරය ලබා ගත්හ.මද වේලාවකට පසු සියලු දෙනා එම හෝටලයේම පිහිටි උද්‍යානයක විවේකීව ගත කිරීමට තීරණය කලේ මේ මොහොතේ තිබෙන

කාලගුණය නිසා පිටතට යෑමට මද කම්මැලි ස්වභාවයක් ගත් බැවිනි .

"අම්මා මං තරූත් එක්ක ටවුන් එකට ගිහින් එන්නද?." මන්දු එය ඇසුවේ ළදරුවෙකු විලසිනි.

"ආහ් ඒ මොකටද එපා ඕන නෑ දෙන්නත් එක්ක මෙහෙට වෙලා ඉන්න" රෝශිනී සුපුරුදු මවකගේ වදන් ප්‍රකාශ කලාය.

තරූගේත් මන්දුගේ ත් මුහුණු කජු ලෙල්ලකට සමාන විය.

"කමක් නෑ රෝශිනී ඕන් ඔහේ ගිහින් ආපුවාවේ , එයාලා ආවේ විනෝද වෙන්ඩනේ. පුතා අයියාවත් එක්ක යන්න" වසන්ත මද සිනාවක් සමග පවසන විට මන්දු බැලුවේ ලොකු දෙසයි.

පෙම්වතිය සමග ඔවුන්ගේ ම ලෝකයක තනි වී සිටින තම සොයුරා දැක මන්දුට ඇති වූයේ අනුකම්පා සහගත සිතිවිල්ලකි.

"අප්පච්චි දැන් නම් එයාව ගලවා ගන්නවා බොරු" මන්දු පැවසුවේ සැබෑවක් ය.

"ඒකත් ඇත්ත තමා කමක් නෑ පුතා පරිස්සමින් ගිහින් එන්න"

වසන්තටත් රෝශිනීටත් සමු දී තරූත් මන්දුත් බදුල්ල නගරයට යෑමට පිටත් විය.ඒ තරූගේ මාමා හමුවීමටයි.

"මල් මදහාස පීදෙනා
නිල් නෙතු ඈගේ වාසනා....."
ප්‍රසිද්ධ ගීතයක පද වැල් මුමුණමින් ගිය මන්දුට එකවර ප්‍රශ්නයක් සිහිවිය.

"මේ බං තරූ දැන් ඔය මාමා බැදලා නැද්ද උඹ ඔය තකහනියක් කෑම මලු උස්සන් යන්නේ" මන්දු ඇසුවේ ඒ සැකය දුරු කර ගැනීමේ චේතනාවෙනි.

"නෑ බං එයා බැඳලා හිටියේ හරිම ලස්සන නැන්දා කෙනෙක්ව.උඹ දන්නවද ඒ නැන්දට හරිම ලස්සන හිනාවක් තිබ්බේ, ඒත් අවුරුදු 10කට විතර කලින් හදිස්සියේම එයා ඇක්සිඩන්ට් වෙලා  නැතිවුණා.ඒකත් එක්ක මාමාත් හරියට ලෙඩ වුණා."තරූ පැවසුවේ වේදනාවෙනි.

"අනේ පව් බන් එතකොට මෙච්චර දවසක් එයා වැඩ කර ගත්තේ තනියමද"

එම පැනයට පිළිතුරක් නොදීම තරූ මඳ දුරක් ඉදිරියට ඇදුණි.

"හ්ම් ඔව් ඒ , අයියලා පුංචි කාලේ දැන් එයාලා ලොකුයිනේ මාමාව බලා ගන්නවා ඇති." සුසුමක් සමඟම තරූ පිළිතුරු දුන්නාය.

"අයියා කිව්වේ"

මන්දුගේ මීලඟ පැනයත් තරූට යොමු කළා ය.

" ආහ් කියන්න අමතක වුණානේ මන්දු , මේකේ තියෙන්නෙ නම් අපේ අම්මා හදපු වඩේ වගයක්, ඒත් ගෙදරට මොනා හරි  අරන් ගියා න්ම් හොඳයි නේ" තරූ පැවසුවේ අත ඇති පාර්සලය දෙස බල්මින් ය.

පසුව දෙදෙනාම ඉදිරියට හමුවූ කුඩා ප්‍රමාණයේ වෙළෙඳසැලකින් අවශ්‍ය බඩු මිලදී ගත්හ.නැවතත් ගමන ආරම්භ කල ඔවුන් ට තරූගේ මාමාගේ නිවසට ළඟා වීමට හැකි විය.

එය තනි මහලේ කුඩා හුරුබුහුටි නිවසක්.වහළ උළු කැට වලින් සෙවිලි කර තිබුණද කඳු පමුල පිහිටීම නිසා එය මීදුමෙන් වැසී ගොස්ය.නිවස ඉදිරිපස ඇති කන්ඩියෙහි අලංකාර මල් වැල් කිහිපයකින් සරසා ඇත.ගෙයි මිදුලෙහි නවීන මාදිලියේ පා පැදියක් නවතා තිබෙන බව දුටු මන්දු එය මෙහි සිටිනවා යැයි කියපු තරූගේ නෑදෑ සොහොයුරා ගේ බව සැක කළා ය.

තරූ නිවසට පිවිසෙනවාත් සමග මන්දුද ඇයත් සමග පිවිසියා  ය.නිවසට පැමිණෙන සියල්ලන්ගේම සපත්තු සෙරෙප්පු බහා ලීමට අමුතු වර්ගයේ අපූරු නිර්මාණයක් ගෙයි ඉදිරියේ තිබෙනවා මන්දු දුටුවේ එවිටයි.

"ගෙදර කවුරුත් නැද්ද.....? තරූ මඳ හඬකින් විමසුවා ය.

නිවසේ ඇතුළත ද පිටත ද එකම පිළිවලකි. නැවුම් සුවඳකි. නිවසේ සිට කව්රුන් පැමිණෙනවා යි දෙදෙනා ට දැනුනි.

"අනේ තරූ අක්කා ඔයා,...?" ගෙ තුලින් පැමිණි කොලු ගැටයා

තරුව බදා ගත්තේ ක්ෂණයෙනි.

" ඔයාලා ඉතිං හැමදාම එන්න එන්න කිව්වනේ ඔන්න මං ආවා, ඉතිං කොහොමද මල්ලි  O/l වැඩ පාඩම් කරනවා නේද..?"

තරූගේ පැනයෙන් මන්දු ඔහුගේ වයස පිළිබඳව දැන ගත්තා ය.

" ඔව් අක්කේ පාඩම් නම් කරනවා කොහෙද හැමදාම කල් යයි කල් යයි කියනවානේ එපා වෙනවා එතකොට ,... අක්කා වාඩිවෙන්න"  ඔහු ඉන්පසු මන්දු දෙසට කුතුහලයෙන් පිරි බැල්මක් හෙලුවේ ය.

" ආහ් එහෙම වුණා ට කමක් නෑ ඔයා වැඩ ටික කර ගන්න ඕනෙ. මල්ලි මේ ඉන්නේ මගේ යාලුවා මන්දෝදරී , ඔන්න මේ අක්කට තමා පිං දෙන්න ඕන.නැත්තං මට එන්න වෙන්නේ නෑ"

මන්දු ඔහුට පෑවේ සුන්දර සිනහවක් ය.

"ඕ ඉතින් අක්කලට බොන්න මොනාහරි හදන් එන්නද එහෙනම් " ඔහු එය පැවසූ විට මන්දුට දැනුනේ ඔහු පිළිබඳ අනුකම්පාවකි.

"යං මාත් එන්නම් ඔන්න ලොකු නැන්දා වඩේ හදලා එව්වා " තරූ එසේ පවසමින් ම කුස්සියට වැදුණේ මන්දුව සාලේ තනි කරමින් ය.

මේ වෙලාවෙහි ඇය කුස්සියට යෑම නොසුදුසු බව මන්දු සිතා ගත්තාය. එනිසා ඇය නිවසේ ඇති නිර්මාණ දෙස බැලුවා ය. නිවසේ එක් පසකින් වැඳිරියක් වඳුරු පැටවෙක් ව තුරුළු කරමින් සිටින පෝස්ටරයක් විය.වැඳිරිය මද නොසන්සුන් බවක සිටී.සමහර විට ඔවුන් දෙදෙනාට අනතුරක් විය හැක.කෙසේ වෙතත් වැඳිරිය පැටවාව තම පපුවට තර කර ගෙන සිටින්නේ තමාගේ වටිනාම වස්තුවක් ආරක්ෂා කරනවා මෙනි.

එය සත්‍යයක් .සෑම මවකටම තම දරුවා වස්තුවක් , මන්දුගේ සිතට මේ සිතිවිල්ල පැමිණි විට ඈට සිහි වූයේ තරූ ගේ මල්ලිවයි.

නමුත් තරූ පැවසුවේ අයියා ලෙසිනි, එසේ නම් තවත් පිරිමි දරුවෙකු මෙහි සිටිනවා විය යුතු ය.

දැන් හවස 5 පමණ වන්නට ඇත.මන්දු අහස දෙස බැලුවාය.එය ඈත සිට කලු කර ගිගුරුම් දීමට ආසන්නය.මන්දු තරූ සොයා කුස්සියට පිවිසියේ මේ පිළිබඳ ඈ දැනුවත් කිරීමටයි.මන්දු එහි යන විටද තරූ හරි හරියට මල්ලිත් සමග කතාවක...

"තරූ බං වහින්න එන්නෙ අපිට යන්න බැරි වෙයි"

"අප්පටසිරි ඔව් මයි" තරූ එය පවසනවාත් සමග හීනි හිරිකඩ , මහ වතුර බිංදු ව බිමට පතිත විය.සිසිල් සුළඟ මන්දුගේ ගතෙහි වෙළුනද ඇය නොවේ එය තැකුවේ.මන්ද මෙවෙලෙහි ඇයගේ අවධානය නැවත යාම පිළිබඳවයි

" පුතාලා දැන් ගියොත් ඔයාලා දෙන්නටම අනතුරක් වෙන්ඩ පුලුවන්.අද මෙහෙ ඉදලා හෙට ගියානම් නේද හොඳ, මොකො නුහුරු තැනක් යැ" තවත් පුද්ගලයකු එහි සිටිනවා මන්දු දුටුවේ එවිටය .ඒ තරුෑගේ මාමා විය යුතුය . තරමක රැලි වැටුණු උඩුකය, තැනින් තැන ඇති සුදු කෙස් ගස්, හැකිලී ගිය ශරීරය ඔහුට ලෙඩ පාටක් එක් කලේය.

" මාමා කිව්වට මන්දුට එහෙම බෑ . එයාගෙ අම්මයි අප්පච්චියි එයාව හොයයි .මටත් බැනුම් අහන්න වෙයි.අපි කොහොම හරි යන්නම් මාමේ" , මන්දුටත් මේ වෙලාවේ ඉතිරිව තිබුණෝ මේ අදහස පමණි.

දෙදෙනාම එම අදහසින් යෑමට පිටත් වුණි.නමුත් හදිසියේම අකුණු කොටමින් වරුසාව ප්‍රබල විය.ඉමක් කොනක් නොපෙනෙන මෙන් මුළු පරිසරයම අඳුරු විය.

"අක්කේ මෙහෙ ඉඳලා ගියොත් හොඳ නැද්ද..." දැන්නම් මල්ලි පැවසුවේ සත්‍යයක් ය.

"ඒත් මල්..." මෙවර මන්දුයි තරුෑව නැවතුයේ.

"නෑ බං මල්ලි හරි අපි දැන් ගියොත් , මොනාහරි වෙන්න පුලුවන් .අනික අප්පච්චිලත් අපිට බනීවී .මෙහෙ ඉන්නවා කිව්වොත් එයාලා සැනසීමෙන් ඉඳීයි නෙ.අපි අම්මලාට කෝල් එකක් දෙමු අද මෙහෙ ඉන්නවා .හෙට උදේම මෙහෙට එන්න කියලා" තරුෑ ට කරුණු පැහැදිලි කර දුන් මන්දු දුරකථන ඇමතුමක් ගත්තේ වසන්තටයි.

"එහෙනම් අක්කලාත් ඉන්න එකේ කට්ටියටම රෑට කෑම

හදන්නද අප්පච්චි" මල්ලි එය පැවසුවේ සිනහවෙන්මයි

"ආහ් ඉන්න අපි දෙන්නා හදන්නම්" තරූ නැවතත් කුස්සියට පිවිසියේ මන්දු දුරකථන ඇමතුමේ සිටින අතරවාරෙයි.

වර්ෂාව එන්න එන්නම දරුණු විය . මන්දු සාලයේ පෙට්ටගම උඩ පිහිටි මනාල යුවලකගේ පිළිමය අතට ගත්තා ය.

"ලොකුත් එදාට මේ වගේ ඉදීවි." මන්දු සිනා රැලක් පිළිමය දෙසට පා කෙරුවේ ලොකුගේ මංගල දිනය ගැන සිහින මවමින් ය.

ලොකුට ශෙනායා අක්කා මුණ ගැසෙන්නේ අහම්බෙනි.එදා පටන් ලොකු ඇයට ආදරය කලේ උන්මත්තිකයෙක් ලෙසිනි.ලොකු පවසන පරිදි ඔහුට හමු වූ හොඳම මිතුරියද ඇයයි.මන්දු ලොකුගේත් ශෙනායා අක්කගේත් ආදර කතාවෙහි රසිකාවියක් ය. මීට අවුරුදු 3ට පෙර ලොකුගේත් ශෙනායා අක්කාගෙත් විවාහ මංගල්‍යය තීන්දුව තිබුණද හදිසියේ ශෙනායාගේ පියා මිය ගියේ ය.නමුත් එම අවස්ථාවේ ලොකුගේ හැසිරීම මන්දුව ඔවුන්ගේ ආදර කතාවේ රසිකාවියක් කලේ ය. ලොකු ශෙනායාට පැවසුවේ ඔහුට තව ඉවසිය හැකි බවයි.ශෙනායා තම පියාගේ සෙවනැල්ල දුටුවේද ලොකුගෙනි.එබැවින් එම සිදුවීමෙන් ශෙනායාටද ලොකු කෙරෙහි ඇති ආලය උග්‍ර කරවීය.

" අප්පච්චි ඇයි අර ඉදල එළියේ , අදත් අතුගෑවා නේද?"

එම පිරිමි කටහඬ මන්දුට පියවි සිහිය ලබා දුන්නේ ය.

මන්දු එදෙස බැලුවා ය.

ඔව් එම ඇස් , ඒ කඩා හැලෙන කොන්ඩය , එම සිරුර ඇයව ආකර්ෂණය කර ගත්තේ ය..ඇය නැවතත් ඇගේම ලෝකයක....ජීවිතයේ ඇයට නුපුරුදු හැඟීමක් ඒ රුවින් විහිදෙන්නට විය. ඒ කඩවසම් රුව දෙස මන්දු ද මන්දු දෙස ඒ දේහදාරී සිරුර ද ඇස් ගල්වා මොහොතක් බලා සිටියේය .

"අප්පටසිරි ලොකු අයියා දැක්ක කල්..." මෙවරත් තරූ බාධක දැමුවාය. මන්දු පමණක් නොව ඔහුද වර්තමාන ලෝකයට පිවිසියේ එවිටය.තරූට තිබෙන්නේ වියළි තල් කොළයට බොරොළු දමනවා වැනි කටහඩක් වුවද ඇයගේ මෙම ස්වරයට ඊටත් වඩා ඉහළ ශබ්දයක් ගත්තාය.

"ආහ් මොකො මෙයා මෙහෙ එකපාරටම" මන්දුගේන් ඇස් ඉවතට ගත් තරුණයා තරූට පැවසුවේ මද සිනහවකිනි.

නමුත් මන්දු නැවතත් එම නිල් ඇස් තුල සැඟවූවා ය.

" මාමේ බලන්නකෝ අනේ  අයියා කියන කතාව .කෝල් කරන හැම දවසකම මෙහෙ එන්නවත් එපා නිකමට කියලා අනං මනං කියනවා දැන් අහනවා ඇයි මෙහෙ කියලා" තරූ තරුණයත් සමඟ අමනාපව එසේ පවසද්දී මන්දු තවමත් නිසොල්මනේ ඒ ඇස් මත දෑස් ගල්වා ගෙනය.

" ඔන්න ලොකු පුතේ අද නම් අපිට ඉන්න හම්බෙන්නේ නෑ අද ආපු වෙලේ ඉඳලා මේ ගෙදර හෙල්ලෙන්න කෑ ගහනවා " තරූ ගේ මාමා තරූට සහය නොවී  තරුණයාට කේලම පැවසීය .

" අනේ යන්න මාමේ තරහම තරහයි මං ඔයාලා හැමෝම එක්ක . මං යනවා එහෙනම් ආපහු මන්දු එක්ක" තරූ එසේ පවසමින් මන්දුගේ දෑත අල්ලා ගත්තාය.

දැනුයි මන්දු හරි සිහිය ලැබුවේ , ඇය වික්ෂිප්තව තරූ දෙස බැලුවා ය.

" මොකෝ බං නිකන් සීතල වෙලා ගියේ මෙච්චර වෙලා කොයි ලෝකෙද හිටියේ... එනිවේ බං මේ ඉන්නේ අපේ අයියා මිස්ටර් රන්දිව් අරෝෂ තේනුවර. අයියේ මේ ඉන්නේ මගෙ වන් ඇන්ඩ් ඔන්ලි බෙස්ට් මිස් මන්දෝදරී තිසාක්‍යා සළුවඩන එහෙම නැත්තං මන්දු " තරූ එසේ පවසමින් දෙදෙනාට හඳුනා ගැනීමට ඉඩ දුන්නාය.

"රන්දිව්..... " මන්දුගේ මොලය ඒ නම තැන්පත් කලේ ඇගේ හදවතෙහිය.

"අප්පච්චි බඩගිනී කාලා ඉමුද?" මන්දුට ආඩම්බර සිනාවක් පා කල ඔහු කුස්සියට ගියේ ය.

තරූත් ඔහුගේ අතකින් වෙලී ඔහු පසුපස ගියා ය.

නමුත් මන්දු තවමත් සිටි තැන එලෙසම ය. ඒ දිගැටි ඇස් වල ඒ සිනහවෙහි අලුත් බවක් මන්දු දුටුවා ය..එය ඇයට ලොල් ය. නමුත් ඇයට එය නිශ්චය කර ගැනීමට නොහැකි විය.

රාත්‍රී භෝජනයෙහි රස විදිමින් සැවොම සිටියේ ආගිය තොරතුරු විමසමින් ය.
පසුව ඔවුන් සියලු දෙනා සාලයෙහි වාඩි විය.

"මේ අපි  truth or dare කරමු ද" තරූගේ අදහසට මන්දු ද රන්දිව් ද මල්ලි ද එකඟ වුණා.
සියල්ලෝම සාලයේ බිම වටේට ඉඳ ගත්තේ සෙල්ලම පටන් ගැනීමේ අරමුණෙනි.මල්ලි ගොස් පෑනක් ගෙන එය බිම තබා කැරකුවේය.

පලමු වටය පැමිණියේ මල්ලි ට සහ රන්දිව්ටය .
"ආ එළකිරි මං අහන්නම් අපේ ලොක්කගෙන්" මල්ලි උඩ පැන පලමු ප්‍රශ්නය රන්දිව් ට යොමු කලාය.

"මුලින්ම කියන්නකෝ truth or dare " රන්දිව් පිළිතුරු දුන්නේ dare ලෙසිනි.

" ආහ් එහෙනම් මෙච්චරයි කරන්න තියෙන්නේ අපේ එහා ගෙදර ලතා ආච්චිගේ ආදරණීය ටීවී එකේ රිමෝට් එක උස්සන්න ඕනේ." මල්ලි එය පැවසූ වේ කපටි සිනහවක් සමඟයි

" ඒයි එහෙම එපා පව් අනේ" මන්දු පැවසුවේ අග මුල නොදැනය.

" අක්කා දන්නේ නෑනේ එයාගෙන් තියෙන වදේ . අද ඔයාලට හොඳට නිදා ගන්න ඕනෙ නම් මේක අයියා ට කරන්න දෙන්න .අපේ එකා දස්සයා " මල්ලි එසේ පවසද්දි රන්දිව් එම කාර්යය කිරීමට සූදානම් වුණා.

" හරි එහෙනම් මං යන්නම් හැබැයි මට සපෝට් එකක් ඕනේ"

රන්දිව් එසේ පවසා මන්දුටත් තරූටත් මල්ලිටත් තම සැලස්ම පැවසුවේය.

මන්දුත් තරූ ත් ලතා ආච්චිගේ ගේ පිටුපසට ගොස් සැඟවුවෝ ය.මල්ලි ගෙයි සාලය පෙනෙන පරිදි ඇතින් සිටියේ ය.මොවුන් මේ සැලසුමකට අනුව වැඩ කරන්නේ මෙය හසුවුවහොත් ඔවුන්ගේ අවසානය ළඟා වන බව සිහි කරමිනි.

රන්දිව් සැලසුමේ ප්‍රධාන කාර්යය කිරීමට ලතා ආච්චිගෙ නිවසට පිවිසියේ ය.

"ආහ් පුතා , මොකො මෙහෙ"ලතා ආච්චි ගොරහැඩි කටහඬකින් ඇමතුවාය.

" ආ මෙ..මේ ආච්චි මට මේ ගිනි පෙට්ටිය පොඩ්ඩක් දෙන්නකෝ " රන්දිව්ගේ කටට පැමිණි යේ එවන් බොරුවකි.

"ඉතිං මොකෝ බං ඕකට ඔච්චර ගොත ගහන්නේ හිටහන් මං අරගෙන එන්නම්" ලතා ආච්චි එසේ පවසමින් ගිනි පෙට්ටිය සොයන්නට ගියේ කුස්සියටයි.

දැන් අවස්ථාව තරූට සහ මන්දුටයි.සැලසුමට අනුව ඔවුන්ට තිබුණේ ආච්චි කුස්සියේ සිට පැමිණෙන විට ඒ බව රන්දිව් ට දැනුම් දීමයි.

"තරූ ආච්චි ගිනි පෙට්ටිය ගත්තා ඔන්න දැන් එනෝ."මන්දු තරූ ට පමණක් ඇසෙන පරිද්දෙන් පැවසුවා ය.

" අයියේ ආච්චි එනෝ"තරූ ගොස් රන්දිව් ට එය පැවසුවා ය.

"කෝ බං මේ රිමෝට් එක ආහ් මේ තියෙන්නේ බඩු.." ආච්චි එනවත් සමග රන්දිව් රිමෝට් එක තම කලිසම් සාක්කුවට දමා ගත්තේය.

"යේ යේ..... අම්මෝ කාලෙකින් ඒ වගේ ආතල් එකක් ගත්තේ අඩෝ තරූ මරු බං ඒක" මන්දු තරූගේ අතෙහි එල්ලෙමින් කෑ ගසමින් නැවත ගේ තුළට ගියා ය.

සිව් දෙනාම නැවත සාලයේ වාඩි වී කල වීරක්‍රියාව පිළිබඳ කතා කලෝ ය.

"මොනා උනත් මං නම් බයෙන් හිටියේ" රන්දිව් පැවසුවේ සැබෑවක් ය.

"ඒකට මොකද ..දැන් හරිනේ දාන්න එහෙනම් පහක්" තරූ එසේ පවසා අත දිගු කලේ රන්දිව් දෙසට යි.රන්දිව් තරූටත් මල්ලිටත් අවසානයේ මන්දුටත් පහක් දම්මේ ය.

නැවතත් ඒ ඇස් යුවල එකට ඇලුනි. මද වේලාවක් ඔවුන් ඔවුන්ගේ ම ලෝකයක තනි විය.. දෙදෙනා දෙසම බැලූ තරූට මන්දුගේ මේ හැසිරීම ගැන ඇති වූයේ නොපැහැදිලි හැඟීමකි.

" හරි ඔය තියෙන්නේ මන්දු මේක උඹට " මන්දු තිගැස්සී පියවි ලෝකයට ආවාය.මන්දු ට තිබුණේ තරූ ගේ පැනයට පිළිතුරු දෙන්නයි .

"උඹට ක්‍රශ් එකක් ඉන්නවද" තරූ ගේ මේ අනපේක්ෂිත

පැනයට පිළිතුරක් නොදීම මන්දුගේ ඇස් යොමු වුණෝ තමා ඉදිරියේ සිටින රන්දිවි දෙසට යි.

"උඹට ..... ක්‍රශ් .... එකක් ඉන්නවද .?" නැවතත් තරූ ප්‍රශ්නය යොමු කලේ මන්දුගේන් පිළිතුරක් නැති කලයි.

මන්දු ක්ෂණික ව තම හිස දෙපසට වැනුයේ නැතැයි කියන්නට ය.ඇය එසේ සිදුකලේ තරූගේ දෑස් දෙසවත් නොබලා ය.මෙය තරූට අමුත්තක් ගෙන දුන්නද ඇය එය පිටුපස හබා ගියේ නැත.

මීලඟ ප්‍රශ්නයද මන්දු ට හිමි විය.නමුත් එය රන්දිවි ගෙන් ඇසීමට ය.

" ශා එල අහපන් මන්දු කොර වෙන්නම" තරූ එසේ පැවසුවද මන්දු ට එය ගෙනාවේ අපහසුවකි.මන්දු ගේ බඩේ සමන්නලල්ලුද පිනුම් ගසනවාක් වැනි හැඟීමක් ඇති වුවද ඇය උත්සාහ කලේ කෙසේ හෝ ඒ වත දෙස බැලීමට ය

"ම්ම් මෙ රන්...මම මේ.... ඔයා.. මට නිදිමතයි තරූ.. මං යනවා" මන්දු හදිසියේ නැගිට කාමරයට වැදුනේ සියල්ලන්ගේම දෑස් උඩ යන විටය.

"මේකිට මොකද වුණේ එකපාරටම දැන් අහන්න නෑ හෙට බලමුකෝ " තරූ හිතුවා පමණි.රන්දිවි ව ඇස් අයාලා බලා සිටියේ මන්දුගේ මේ හැසිරීම දෙසයේ.

"මට මොකද මේ වෙලා තියෙන්නේ.ඇයි එයාත් එක්ක කතා කරන්න යන හැම වේලාවෙම මං පිස්සුවක් කෙලින්නෙ.මන්දු

ඔයා මෙහෙම කලොත් එයා මොනව හරි හිතයි.තරුත් මොනවා හරි හිතයි.මොකද ඒ මට වුණේ " මන්දු ඇගේ සිතත් සමඟගම සාකච්ඡාවක්.මද වේලාවකට පසු තරූ කාමරයට පැමිණිය.ඒ වන විටත් මන්දුට නින්ද ගොස් තිබුණි.

පසු දින උදයේ මන්දු අවදි වූයේ හිරු කිරණටයි.ඇය නැගිට එළියට ගියාය. වසන්ත ඇමතුමක් අරගෙන තිබූ නිසා ම ඇය මුලින්ම කලේ නැවත ඔහු ඇමතිමයි.පසුව ඇය නාන කාමරයට වැදුණේ සිය අවශ්‍යතා ඉටු කරලීමට ය.

" ගුඩ් මොර්නින් මගෙ මන්දුවෝ" තරූ කුණු කෙල පිටින්ම මන්දු  සිඹ නාන කාමරයට වැදුනාය.

"ශික් බලනවා තරූ මූණ හේදුවා විතරයි ." ඇය තරූ ට බැන බැන ම කුස්සියට ගියා ය.

ඇය එහි යන විට මාමා එළවළු සෝදමින් සිටියේ ය.

"ගුඩ් මෝර්නින් මාමේ"

" ආහ් පුතේ හොදට නින්ද ගියා ද.මං මේ බැලුවේ උදේට මොනා හරි හදන්න කියලා"

" අයියෝ මාමා කරදර වෙන්න ඕනේ නෑ අපි උයන්නම් .මාමා ඉන්නකෝ" මන්දු එසේ පවසත් ම තරූ ත් කුස්සියට ආවා ය.

" අයියෝ අදත් උයන්න ඕනේ ද" තරූට නම් අවශ්‍ය වුණේ තව වේලාවක් නිදා ගැනීමට ය.

" ඔව් අදත් ඕනේ මාමාව බලන්නනේ ආවේ එහෙනම් වරෙන් මේ ටික කපන්න" මන්දු පැවසුවේ ගොටුකොළ මිටිය තරූ වෙත පාමින් ය.

" ආහ් මේ චිකරේ මොකො උදේන් ම නැගිටලා " රන්දිව් ද කුස්සියට පැමිණි යේ ඉන් පසුවයි.තරූගේ ඔලුවට ඇගිල්ලෙන් ඇන ඔහු බැලුවේ මන්දු දෙසයි.

" අනේ මට නම් අමාරුවක් නෑ කුකුළා කටේ දාගෙනම නැගිටින්න මෙන්න මේකි තමා මාවත් නැඟිට්ටෙව්වේ.." තරූ ගේ චෝදනාව මන්දුටයි.

" ගුඩ් මෝර්නින් මන්දු " රන්දිව් ඇයට හිමිහිට කීවේ ය.

" ආහ් ... ගුඩ්.. මෝර්නින් අයියේ..." මන්දු ට මෙවර වචන කිහිපයක් ගැට ගැසීමට හැකි විය.

මද වේලාවකට පසු ඔවුන් සියලු දෙනාම කුස්සියෙහි කාර්‍යබහුල වූයේ උදෑසන ආහාරය සෑදීමේ කාර්‍යයත් සමග යි. සියලු දෙනාම හරි හරියට වැඩ වල නියැලෙමින් ආහාර සකස් කලෝ ය.විටින් විට රන්දිව් ගේ දෑස් මන්දු දෙසට ද මන්දුගේ ඇස් රන්දිව් දෙසට ද එල්ල වූයේ තරූගේ සැකය දියුණු කරමිනි. සාලයෙන් ඇසුනු හුරුපුරුදු කටහඬ ට මන්දු දිව ගියේ වේගයෙනි .

" අප්පච්චි .... අම්මා.." ඇය දිව ගොස් නැවතුනේ වසන්තවත් රෝශිනීවත් වැලඳ ගෙනය.
මන්දුගේ ශබ්දය ට කුස්සියෙහි සිටි තරූ ත් රන්දිව් ත් සාලයට ආවෝ ය.

" දෙන්නා එක්ක තනියෙන් ම ආවා නේද" ශෙනායා තරූ ගේ කන මිරිකමින් ම පැවසුවා ය.

" හෝව් හෝව් .... ඉන්නකෝ මට කෙනෙක් හඳුන්වලා දෙන්න තියෙනවා . මේ ඉන්නේ මගේ මාමාගෙ පුතා රන්දිව් මේ එයාගේ මල්ලි.අයියේ මේ ඉන්නේ මන්දුගේ අම්මයි අප්පච්චියි අයියායි නෑනයි." තරූ එසේ පවසමින් දෙගොල්ලටම  හඳුනා ගැනීමට ඉඩ දුන්නා ය.

පසුව සැවොම එකතු වී අල්ලාප සල්ලාපයේ යෙදෙමින් උදෑසන ආහාරය රස වින්දෝය.වසන්තත් තරූ ගේ මාමාත් බර කතාවක්.ලොකු ත් රන්දිව් ත් දෙදෙනා මිදුලේ හි කුමක් දෝ කරති.දහවල ළඟා වෙත්ම මන්දුගේ පවුලේ අය සැරසුණේ නික්මීමටය. තරූත් මන්දුත් මාමාට වැඳ රන්දිව්ටත් මල්ලිටත් සමුදී රථයට නගුනෝ ය. මන්දු නැවත රන්දිව් දෙස බලා දුක්බර සිනාවක් පෑවා ය.ඇයට තේරුම් ගත් නොහැකි කුමක්දෝ දුකකින් හිත පිරී ගොස් ය.රන්දිව් ඇයට අත වනා සමුදෙන්නට විය.

*****

හිරු අහසේ රජ කරමින් සිටී.අහස එකම පාටක්.මේ මාස දෙක ගෙවී ගිය වේගය මන්දු ට සිතා ගැනීමට නොහැකිය. කෙසේ වෙතත් ඇයට යම් සතුටක් වූයේ නැවත විශ්වවිද්‍යාලය ආරම්භ කරනවා යැයි වූ පුවත ඇසීමෙනි.හෙට දිනයේ මන්දුත් තරූත් කොළඹ ට පිටත් ව යෑමට තීරණය කලේ විශ්වවිද්‍යාලය පටන් ගැනීම කට උඩ තියාගෙන යෑම අවධානම් බැවිනි.තරූ ත් මන්දු සමග යෑමට එන බව පැවසූ නිසා මන්දු සිටියේ තරූගේ පැමිණීම

අපේක්ෂාවෙනි. හවස තුන පමණ වන විට තරූ මන්දුගේ නිවසට පැමිණියා ය.

" ආහ් මේ ඉන්නේ කෙල්ල, උඹ තාම බඩු පැක් කරනවා ද" මන්දුගේ කාමරයට පැමිණි තරූ ඇහුවේ ඇය තවමත් රෙදි මලු සකසමින් සිටි නිසා ය.

" ඔව් බං මේ සැරේ ටිකක් වැඩිපුර බඩු ගෙනියන්න ඕනෙ. ආහ් ඒක නෙමේ  තරූ අපිට උදේ ම පිටත් වෙන්න වෙයි නේද.?"

" මාත් මේ ඒක තමයි පුතේ චූටිටත් කිව්වේ"  රෝශිනීත් ඔවුන්ගේ කතාවය එකතු වූවා ය.

" ඕනේ වෙන්නෙ නෑ ආන්ටි, අපේ රන්දිව් අයියා , එයත් හෙට තමා කොළඹ යන්නේ එයාගේ ප්‍රොජෙට් එකකට. අපිට එයාත් එක්කම යන්න පුලුවන් නේ" තරූ එය පැවසුවේ මන්දු ගේ මුහුණ දෙස බලමින් ය.

"ආහ් ඒක නම් හොඳයි පුතේ එතකොට ඔයාලට පරිස්සමින් ම යන්න පුලුවන් මං අංකල්ටත් කියන්නම්කෝ.රන්දිව් පුතාට එහෙනම් උදේට මෙහෙට එන්න කියන්න පුතේ." රෝශිනීත් එහෙම කියාගෙන පහලට ගියා ය.

මන්දු සිටියේ පුදුමයෙන් . රන්දිව් දැක ගැනීමට ඇයට උවමනාවක් තිබුණේ නැතැයි කිව නොහැකිය.නමුත් මේ අනපේක්ෂිත සිදුවීම ඇයට ගෙනාවේ සතුටකි.එම සතුට ඇයව නොඉවසිලිමත් කලා ය.

උදෑසනම ඔවුන් යෑමට සූදානම් විය.මන්දු සිටියේ කොන්ඩය සකසමින් ය.

" අම්මෝ ලොකු දෙයක් දැන්වත් මට කනක් ඇහිලා ඉන්න පුලුවන්" ලොකු පැවසුවේ මන්දුගේ ඇඳ මතට පනිමිනි.

නමුත් මන්දු සිටියේ තම පවුලේ අය හැරදා යෑම පිළිබඳ කනගාටුවෙනි.ඉදින් ලොකුගේ එම කතාව මන්දුගේ දුක කඳුලු වලට පරිවර්තනය කලේ ය.

" ඒයි අඬනවා ද ? , අයියෝ නංගි විහිලුවක් කලේ මට තමුසේ නැතිව සිරාවටම පාළුයි. වෙනදා වගේ තමුසේ ව අල්ලගන්නත් ලේසි වෙන්න නෑනේ දැන් .ඒකයි පොඩ්ඩක් ඇවිස්සුවේ අනේ අඬන්න එපා.සොරි...." ලොකුටත් ඇති වූයේ දුකකි.මන්දු ලොකු ට තුරුළු වීම ඇඬුවේ ඇගේ දුක නිවෙනකන් ය.

මද වේලාවකට පසු මෝටර් රථයක් නිවසෙහි ඉදිරිපිට සිට නාද කරනවා රෝශිනීට ඇසුනි.

" චූටී ...තරූ ... රන්දිව් පුතා ඇවිත් ඉක්මනට එන්න නැත්නම් පරක්කු වෙයි ." ඇය .පහළ සිටම කෑ ගැසුවේ ගේට්ටුව අරින්න දුවමින් ය.

මන්දු ලෑස්ති වී පහළට පැමිණෙන විට රන්දිව් සිටියේ තේ කෝප්පයක් අතැතිව යි.

" එහෙනම් ආන්ටි අපි ගිහින් එන්නම් " රන්දිව් රෝශිනීටත් වසන්තටත් දණ නමා වැන්දේ ය.තමාගේ පැමිණීම

අපේක්ෂාවෙන් සියලු දෙනා සිටි බව මන්දු තේරුම් ගත්තේ එවිටය.පසුව මන්දුත් අප්පච්චිට සහ අම්මට වැද අයියාට ද සමු දුන්නා ය.

" පරිස්සමින් පුතේ" වසන්ත ඇගේ නලළත සිඹ හිස අතගෑවේ ය.

ඉන්පසු මන්දු මිදුලට පිවිසියේ රථයට නැගීමේ අරමුණෙනි. ඇයට  රන්දිව් ට යාබදව පිහිටි ඉදිරිපස අසුනෙහි යාමට සිදු වී තිබුනේ තරූ ගමන් මලු සියල්ල පිටුපස අසුනෙහි රඳවා තැබීම නිසා ය. නමුත් තරූ විසින් එය සිතා මතා ම සිදුකලේ මෙම ප්‍රතිඵලය බලාපොරොත්තුවෙනි.අවසානයේ මන්දු ට අනපේක්ෂිතව වුවද ඉදිරිපස අසුනෙහි යෑමට සිදු විය.

පැයක පමණ සිට සියලු දෙනාම සිටියේ නිහඬබව රකිමිනි. මන්දු සිටියේ ඈත සිට නැඟ එන හිරු දෙස බලමිනි.ඇයගේ විශ්වවිද්‍යාල ජීවිතයේ අවසන් බාගය එහෙමත් නැත්තම් අවසාන සෙමෙස්ටරය මෙලෙස ගෙවා දැමීමට යන්නේ කෙසේද යනුවෙන් ඈ වුන්නේ කල්පනාවක ය. පිටුපස අසුනෙහි සිටි තරූට නින්ද ගොස් තිබුණේ උදෑසනම අවදි වන්නට වූ හෙයිනි. මෝටර් රථයේ වායු සමීකරණයෙහි හා අවට පරිසරය එක්ව මන්දු ට ගෙනාවේ සීතලකි.ඇය තම දෙඅත් ගෙන එකට අතුල්ලන්නට වූයේ මද උණුසුම ක් අපේක්ෂාවෙනි.

" මොකො සීතලද" රන්දිව් රිය පදවමින් ඈ දෙස නොබලාම ඇසුවේ මද සිනහවකිනි.

" හ්ම් ටිකක් ..."

රන්දිව් වායු සමීකරණය අවශ්‍ය උෂ්ණත්වයට සැකසුවේ ඇයට පහසුවක් ගෙන දීමට ය.

"දැන් හරිනේ"

මන්දු පෑවේ අහිංසක සිනහවක්.

"ඉතිං මන්දු අපිට හරියට කතා කරන්නත් බැරි වුණා නේ.ඒ නිසා මොනවා හරි කතා කරන්නකෝ.." රන්දිව් සිටියේ ඉදිරියට ඇස් යොමු කරගෙනයි. එය මන්දු ට ගෙනාවේ පහසුවකි.

නමුත් ඇයට මේ වෙලෙහි මාතෘකාවක් සිතට නැගුනේ නැත.එබැවින් ඇය ඔහුට සිනහවක් පිදුවා ය.

" මන්දු දන්නවද ඔයා ට තියෙන්නේ හරි ලස්සන හිනාවක්. ඒකට ඕනෙම කොල්ලෙක් වශී වෙනවා. මන්දු ට නැද්ද ඉතින් ඔය හිනාවට වශී වෙච්ච කොල්ලෙක් ." රන්දිව් එය නම් පැවසුවේ ඇගේ දෑස් මත යැපෙමින් ය.

" නෑ " මන්දු එයට පෑවේ තනි පිළිතුරකි.

" ගුඩ්.. මන්දු ට මොකද මං ගැන හිතෙන්නේ.මං කාට හරි වශී වෙලාද."

මන්දු මදක් ඔහු දෙස බැලුවා ය.ඒ ඇස් හරිම නිර්මලයි. අවංකයි.එය තව කෙනෙකු නමින් දිදුළන ඇස් දෙකක් නොවේ. නමුත් තේරුම්ගත් නොහැකි හැඟීම් සමුදායක් අරක් ගත් ඒ දෑස ඇයට ඉතා ප්‍රියකරු යි

" මට හිතෙන්නේ අයියා තාම හරියටම වශී වෙලා නෑ" මන්දු පැවසුවේ හිතට එකඟවමය.

"හ්ම් එහෙම වෙන්නත් පුලුවන්...........
බටි මං කැමති නෑ අර අයියා කෑල්ලට.ඔයාට පුලුවන් මගේ නම කියලා කතා කරන්න එහෙම නැත්තන් ඔයා කැමති ඕනෙම නමකින් කතා කරන්න"

" හා අයියේ.." මන්දු එය නම් පැවසුවේ විහිලුවක ස්වභාවයෙනි.ඔවුන් තව වේලාවක් එසේ කතා කරමින් ගියේ මන්දුගේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගැනයි.මන්දු සිටියේ රන්දිවි ගැන දැනගනිමිනි.ඇය බොහොම ආශාවෙන් ඔහුගේ කතා වලට සවන්දුන්නා ය.ඇයද ඔහු සමග බොහෝ දේවල් බෙදා ගත්තාය. ටිකකින් මන්දුගේ බඩෙහි පණුවන් පිනුම් ගැසුවේ බඩඉරිඟු සුවඳ දැනුනු නිසාවෙනි.

" අනේ බඩඉරිඟු .... ඒයි අයියා අනේ එකක් අරන් දෙනවකෝ" තරූ අවදි වී රන්දිවිගේ ඉල්ලන්නේ පාර දෙපස ඇති බඩඉරිඟු ය.

" ආහ් ඔයා කොයි වෙලාවෙද නැඟිට්ටේ...දැන් නිදා ගෙනන හිටියේ ?" රන්දිවි තරූ ට පැවසුවේ මෝටර් රථය පසෙකින් නවත්වන ගමන් ය.

" කවුද අනේ මේ සුවඳට ඇහෙරෙන්නේ නැතිව ඉන්නේ. වරෙන් මන්දු චො." එහෙම කියාගෙන ම තරූ එලියට පැන්නේ රන්දිවි ගේ මුදල් පසුම්බිය ද අතැතිව යි.

" මේකි නම්" රන්දිවි සිනාසුනේ තමන්ටම ය.

මන්දු සිටියේ තරූ ගේ අතෙහි එල්ලීගෙනය.ඇය උඩ පනිමින් බඩඉරිඟු තැම්බෙන සැටි බලා සිටියා ය.බඩඉරිඟු මිලදී ගනිමින් සිටි මන්දු දෙස රන්දිව් බලා සිටියේ ආදරණීය ලෙසිනි. ඔහු වඩාත් ප්‍රිය කලේ මන්දුගේ මේ දඟකාර හැසිරීමටය. තවත් ඉවසිය නොහැකිව ඔහු එදෙසට ගියේය.

තරූ අතට ගත් බඩඉරිඟුව මන්දු වෙත පෑවේ "හොදයි ද" කියා අසමිනි. එවිට මන්දු එහි සුවඳ විඳ "සුපිරියි" යනුවෙන් අතින් සැල කලා ය. බඩඉරිඟු මිලදී ගත් ඔවුන් මෝටර් රථයේ සිටම එය අනුභව කලෝ ය. මන්දුගේ බඩගින්න කෙතරම් ද යත් සත්තකින් ම ඇයට එම බඩඉරිඟුව මදි විය.

" ඔච්චර කන්න ආසයි කියලා දන්නවනම් තව එකක් අරන් දෙනවනේ." රන්දිව් සිනහවක් පෑවේ ඇය වෙත ඔහුගේ බඩඉරිඟුව ද දිගු කරමිනි.මන්දු හෙමිහිට එයද අතට ගත්තේ තරූ දෙසද බලමිනි.

"තැන්ක් යූ" මන්දු පැවසුවේ රන්දිව්ගේ දෑස් වලට ය.
තරූ එදෙස බැලුවේ ඇස් හීනී කරමින් ය. ළඟකදී සිට මන්දුගේ මෙම හැසිරීම තරූ ට එක් කලේ නොපැහැදිලි හැඟීමක් ය.කෙසේ නමුත් එය තරූගේ යම් සැකයක් දියුණු කලේ ය.
තවත් පැය දෙකක පමණ ගමනකින් පසු ඔවුන් පැමිණියේ කොළඹ පිහිටි තරූගේ ත් මන්දුගේ ත් බෝඩිමට ය.

" මන්දු ..." බඩු මලු සියල්ල බා ගත් පසු රන්දිව් මෝටර් රථයේ ජනේලයක් පහත් කර මන්දු ඇමතුවේ ය.මන්දු තිගැස්සී ඔහු දෙස බැලුවාය .

"පරිස්සමින් ....." රන්දිව් පැවසුවේ සෙනෙහෙබරවය.

අහිංසක සිනහවක් රන්දිව් ට පෑ ඇය ඔහුටත් එලෙසම සමුදී පිට වූවා ය.

සතියක ට පසු මන්දුත් තරූ ත් සූදානම් වූයේ විශ්වවිද්‍යාලය ට යෑමටයි.මන්දු සිටියේ සතුටින් . උදෑසනම අවදිව ඇය ලොකු ට ඇමතුමක් ගත්තා ය.ඒ එදින ඔහුගේ උපන්දිනය නිමිත්තෙනි.

"හැපි බර්ත් ඩේ අයියා .... "

" ආහ් තැන්ක් යූ ගෙම්බියේ...ඉතින් දැන් යන්න ලෑස්ති ද"

" ඕ ... ඔයාටනම් ඉතින් අද ස්පෙශල් නේ .ඒකනෙමේ ශෙනායා අක්කා ආවේ නැද්ද "

" එයා ඇවිල්ලා ඔන්න අම්මාත් එක්ක උදේ ම පන්සල් ගියා.."

"පවු ලොකු අක්කා ,එයා මාරම ආදරෙයි ඔයාට, "

" හ්ම් ඔව් චූටී මං හිතන් ඉන්නේ තවත් පරක්කු නොකර වෙඩින් එක ගන්න.අප්පච්චි අම්මයි ත් ඊයේ මගෙන් ඇහුවා.ඔයා මොකද කියන්නේ."

" ඔව් අයියා ඒක හොඳයි.කොහොමත් තමුසේටත් ඉවසන් ඉන්න අමාරු නේ.මොනවා කලත් කලබල නොවී කරන්න..මං තියන්නම් පරක්කු වෙනවා" මන්දු ඇමතුම

අවසානයේ හැරුනේ තරූ වෙතයි.තමා අවදි වූ වේලාවෙහි සිට ඇය සිටියේ දුරකථන ඇමතුමක ය.නමුත් එය ඈගේ පවුලේ අයකු නොවන බව මන්දු විස්වාසය.
 කෙසේ නමුත් දෙදෙනා උදෑසන 8 පමණ වෙන්විට විශ්වවිද්‍යාලයට පිවිසියහ.පසුව ඔවුන් තම පන්ති වලට සහභාගි වි දවල් කෑම සඳහා ආපනශාලාවට රැස් වූහ.

" අම්මෝ බං අද නම් එපා වුණා ...." තරූ එසේ කියමින් පොත් බෑගයේ මේසයට අත ඇරියා ය.

" ඔව් බං එසයින්මන්ට් දෙකක්ම තියෙනවා කම්ප්ලීට් කරන්න ." කියාරාත් පුටුවක් ඇද වාඩි විය.

" මන්දුවා කොහෙද ?" තරූ ඇසුවේ ඇයව නොදුටු නිසාවෙනි.

"ඒකි වොශ්රූම් ගියා "

"තරුනි.." ඒ සයාශ් ය.
 තවත් නමකින් කිවහොත් තරූ ගේ පෙම්වතා.ඔව් තරූගේ ත් සයාශ්ගේත් ප්‍රේම සම්බන්ධය පිළිබඳ මන්දු නොදනියි.තරූ මන්දු සමග ඇයගේ සියලු ම දෑ බෙදා ගත්තද ඇය මේ පිළිබඳ මන්දු ට හෙලි නොකලේ මන්ද යන වග තරූ ට එක්කලේ යම් වරදකාරී හැඟීම්කි.

" හායි.... මොකො වෙන්නේ?" මන්දුත් පැමිණි යේ එවිට ය. තරූ තිගැස්සී ඇය දෙස බැලුවාය.ඇය සයාශ් අතරේත් මන්දු අතරේත් අතරමං වුණි .නමුත් ඇය සන්සුන් වූයේ සයාශ් සිටි තැනම නතර වූ හෙයිනි.

මෙම සතිය තුලම මන්දුත් තරූ ත් සිටියේ මදක් කාර්යබහුලවයි.විශ්වවිද්‍යාලයේ අවසාන විභාගය ඔවුන් ට ගෙනාවේ හිසරදයකි.හදිසියේ ම මන්දු අසනීප වූයේ ඒ කාර්යබහුලත්වයේ ප්‍රතිඵලයක් ලෙසිනි.

" අද උඹ හිටහන්.මොකෝ උබ ආවයි කියලා ඔලුව උස්සගෙන අර ලෙක්චර් එක අහන් ඉන්න බෑනේ.මං උබට ඒ ටික කියලා දෙන්නම්.උබ ටිකක් රෙස්ට් කරපන්.බලනවා දැනටමත් ඇඟ රස්නෙයි."

තරූ ගේ ඇනුම් බැනුම් මැද මන්දු බෝඩිමේ රැඳී සිටීමට තීරණය කලා ය.මන්දු ට දැනුනේ තරූ සැබැවින් ම ඇයගේ මව ලෙසය.ඇය කෙතරම් කාර්යබහුලව සිටියද මන්දුගේ සැප දුක සොයා බැලුවේ නිතතින්මය.මන්දු මද නින්දකින් අවදි වූයේ ඇගේ ජංගමය උඩ පනින නිසාවෙනි.

" හලෝ......මන්දු මේ මම" එදෙසින් ඇසෙන පුරුදු හඬ මන්දු තිගැස්සී ය.

" දෙයියනේ රන්දිව් අයියා..." මන්දු අමාරුවෙන් පැවසුවාය.

" කතා කර කර ඉන්න වෙලා නෑ ඉක්මනට දොර අරින්න මං ඔයාලගේ ගේට එක ළඟ."...

" ඔයා ට දැන් කොහොමද ? මට නංගි කිව්වා උණ කියලා කෝල් කරහම...මං ඒකයි තකහනියක් මේ ආවේ..කෝ බලන්න" රන්දිව් ගේ දිගු අත්ල මන්දුගේ නලල් තලය සිපගත්දී මන්දු සීතල වී ගියේ එම අත්ල ඇගේ ගෙලද සිප ගද්දී ය.

" මයි ගෝඩ් ඔයාට හොඳටම උණනේ.." මන්දු එවිට සිටියේත් දැඩි අසනීප තත්වයෙන් ය.ඇය රන්දිව් ට පුටුවක් පෑවේ එය සැලකිල්ලට නොගෙනය.ඇයද එසේම තම ඇඳ මත වාඩි වී ඇඳ විට්ටමට හේත්තු විය.ඇයට මෙවෙලේ රන්දිව් සමග කතා කිරීමට තරම් ශක්තියක් නොවීය.

" නංගි ඔයා ට අමාරු ද අපි හොස්පිටල් එකකට යමු... " මන්දු ඔලුව වැනුවේ බැහැයි කියන්නට මෙනි.

"හරි ...ඔයා කාලද..." රන්දිව් ඇයට ලං වී ඇසුවේ ඇගේ අතකින් ද අල්ලා ගෙනයි.මන්දු උදෑසන ආහාරය ලබා නොගත් බැවින් ඇය සිටියේ තවත් හෙම්බත්ව ය.ඇයට පිලිතුරක් නොදී ම නින්ද ගොසින් ය. නමුත් මද වේලාවකට පසු රන්දිව් ගේ අතැගිලි ඇගේ හිසකෙස් අතර සුමුදු ව දිව යද්දී ඇය නැවත් නැගිටියේ තිගැස්සෙන්ම ය.

" නංගී ඔයා මුකුත් කාලා නෑ එන්න මේ සුප් එකවත් බොන්න...තරූ කිව්වනේ ඔයාට උදේ කටවල් දෙකක් කෑව්වා කියලා..එච්චරමද බඩට දැන් වෙනකං ආ." මද තරවටු ස්වරයකින් ඔහු එසේ පවසද්දී මන්දු එය අපහසුවෙන් පානය කලේ කිසිදු හැඟීමකින් තොරව යි.

" එන්න දැන් ටිකක් නිදා ගන්න ..මං කොහොමත් තරූ එනකන් ඉන්නවා ඔයාව මෙහෙම දාලා යන්න බෑ." රන්දිව් එසේ පවසමින් මන්දු ගේ හිස පිරිමැද්දේ ය.

" ඒත් අයියේ ඔයාගේ වැඩ පාඩු කරගෙන මං වෙනුවෙන් ඉන්න එපා.මේක හරි යයි.දැන් අඩුයි ගොඩක් දුරට." මන්දු ට දැනුනේ දුකකි.ඔහුගෙන් මෙවන් හැසිරීමක් ඇය කවදාවත්

බලාපොරොත්තු වූයේ නැත.එම සිව් ඇස් එකට යා වෙද්දී මෙවර එයට බාධා වූයේ උණ කටුවයි.

"102 ට උණ තියෙන එක අඩුයි කියලද කියන්නෙ දැන් .. මගෙ පණ්ඩිත ආච්චි කටවහගෙන නිදා ගන්න මෙතනින් මං යන්නේ නෑ .." රන්දිව් සිනහවෙමින් ම එසේ  පවසා ඇගේ නලලත මතට ඕඩිකොලෝන් පොඟවපු ලේන්සුවක් තැබුවේ ය.මන්දුට නොදැනී ම නින්ද ළගා වූයේ ඔහුගේ රළු අත් සිනිදුවට ඇගේ හිස කෙස් අතර දිව යද්දීය .

"මන්දුවෝ .... බං මන් තරූ උඹට කොහොමද දැන් ." මන්දු අවදි වූයේ තරූගේ හඬටයි.

"මට අද උදේ යනකොටත් හරි නෑ වගෙ උබව දාලා යන්න.ඒකයි අයියා කතා කලාම කිව්වෙ උබට අසනීපයි කියලා.හැබැයි අයියා එයි කියලා හිතුවේ නෑ ...ඔන්න දැන් තමා ගියේ.." මන්දු එවිටයි දැන ගත්තේ රන්දිව් ගේ නික්මීම මීට සුළු මොහොටකට පෙර සිදු වී ඇත කියා.කෙසේ වෙතත් එම ආරංචිය මන්දු ට එක් කලේ දුකක් මුසු පාලුවකි.

" මෙන්න අයියා උබට බුන්දිත් ගෙන්ල්ලා.." තරූ පැවසුවේ බුන්දි මල්ලට එබෙමින් ය.

*****

" තරූ ඉක්මන් කරන්නකෝ.."
කාලය ගෙවී ගියේ විශ්වවිද්‍යාලයේ අවසන් දින කීපයටයි.අද දින අවසන් විභාගයට මුහුණ දීමෙන් අනතුරුව කවුරුන් කොහේ ද හමුවන්නේ කියා ඔවුන් නොදනිති.ජීවිතයේ සියලුම බාධක අභිබවා ඔවුන් ගමන් කරන්නේ තම තමාගේ

සතුට සොයමින් ය.

" අඩෝ බන් මේ අන්තිම එක මට නම් පට්ට දුකයි බන්..." කියාරා එසේ පවසමින් ම අවන්හලට ගොඩ වුණි....

"හ්ම් මටත් බන් .මාර ඉක්මනින් මේ කාලේ ගෙවුණේ.මට නම් හිතාගන්නවත් බෑ..." මන්දුත් ඇයට එකතු වුවා ය.

" අපිට දැන් අපේ පාරවල් වල යන්න වෙලා බං .එකත් තනියම.මතකද උඹට අපි මේ යුනියට ආපු දවසේ මේකිව හම්බ වෙච්ච විදිය..." තරූ මතකය අවදි කලේ අවුරුදු 4 පෙර සිදුවීමකට ය.

"ආහ් මේ මැඩම්ලා කොහෙද දන්නෙ නෑ නේ මේ හිමීට යන්නේ..." විශ්වවිද්‍යාලයේ නවක වදයට ඔවුන් හසු වූයේ මුල්ම දිනයේ ය.

"මෙහෙට පොඩ්ඩක්  ආවනං" තවත් වැඩිමහල් සොයුරෙක් එසේ පවසද්දී මන්දුගේ තරහ ඉහවහා ගියා ය.මන්දු මේ නවක වදටය විරුද්ධය.එබැවින් ඇය සිතා සිටියේ එම අයියලාගෙ කන් පිරෙන්න මෙවර බණ දේශනා කිරීමටය.

" අනේ බන් පැටලෙන්න යන්න එපා .අපි තව කල් මේකෙ රන් කරන්න ඕනේ ඔය කියන එක කරලා එමු බන්..." තරූගේ ආයචනයට කන් නොදීම ඇය එදෙසට ඇදුණි.

" උඹ කියන්නෙ මට ගිහින් උන්ගේ සපත්තු ලෙව කන්න කියලද.බලපන් අර තව කෙල්ලෙක්වත් තියාගෙන. හිටපන්කො මං ඕකුන්ට.."

" ඇයි...." මන්දු හඬ ගිගිරුවේ ය.

" අප්පටසිරි බලපන්කෝ මේ පුංචි මැණිකාගෙ සද්දේ." ඔහු පැවසුවේ තරු දෙසද බලමිනි.

" නංගි මේ වැඩිය සද්ද දාගෙන නම් එන්න එපා හරිද .මුං යකෝ.. මෙන්න මේ හුරතලි වගේ ඉන්න ඕනේ නේ." ඔහු එම කණ්ඩායමේ නායකයා විය යුතුය.මන්දු සිතුවා ය.ඇය අසල සිටින තරුණිය හැඬීමට සූදානම් ය.

" අනේ අයියේ මේ ... ඕගොල්ලෝ හිතන් ඉන්නේ මේ විදියට අපෙන් වැඩ ගන්නද ....ආ මේ විදියට කෙල්ලොන් ව අඬවන්නද .මොකක්ද මේකේ තේරුම..." මන්දු ට එම වාක්‍ය අවසන් කරන්නවත් වූයේ නැත.ඇය අසල සිටි තරුණිය මහ හයියෙන් හැඬීමට පටන් ගත්තාය.

" සද බොද වෙනවා වගේ බන් .මේ ඔන්න ඔය කෙල්ලො තුන් දෙනා ට යන්න දෙන්න.නංගිලා යන්න කමක් නෑ." සයාශ් පැවසුවේ ය.

මන්දු ත් තරූ ත් සමග අනිත් තරුණියද එතැනින් ඉවත් ව ගියෝ ය. මද වේලාවකින් අර තරුණිය මහ හඬින් හිනා වීමට පටන් ගත්තා ය.

" මේකිට මොනවා වෙලා ද .යකෝ දැන් අර ගිරිය කඩාගෙන ඇඬුවේ ඇයි.එක්කෝ මෙකි මොනා හරි බීලා.නැත්නං මේ කොරෝනා වල 6 වෙනි symptom එක." තරු පැවසුවේ පුදුමයෙනි.මන්දුටද සිතා ගත නොහැකි විය. ඔවුන් දෙදෙනා

ම එම තරුණිය දෙස මහත් විස්මයෙන් බලා සිටියෝ ය.

" හම්මෝ ...කොහොමද මගෙ ඇක්ටින්, අහ් මං කියාරා මෙඩිකල් ." ඇය එසේ පවසමින් ඔවුන් ට අතට අත දුන්නා ය.

" අම්මෝ බන් එදා මන් සිරාවට ම හිතුවේ උබ අර රාට්චසන් එකේ වගේ මානසික ලෙඩෙක් කියලා ඒ විදියට හිනා වෙනකොට." මන්දු ද එම මතකය අවදි කලා ය.

" එදා නම් සිරාවටම උන් ටික බය වුණා ආයෙ එපා වෙන්නම.බලන්න තිබ්බේ සයාශ් අයියාගේ මූණ ." කියාරා එසේ පවසද්දී මන්දු ට යමක් සිහි වූවා මෙන් තරූ දෙස බැලුවා ය.

විභාගය අවසන් කර ඔවුන් සැරසුනේ නිවෙස් කරා යාමට යි.

" තරූ මට උඹත් එක්ක කතා කරන්න ඕනේ.අපි බීච් යං"

" ශා එල එල යං ." තරූ ඇගේ අතක එල්ලී මුහුදු වෙරළ ට ගියා ය.

මුහුදු වෙරළට මුහුණලා තිබෙන බංකුවක ඔවුන් වාඩි විය.මුහුදු වතුරෙහි පවිත්‍රත්වය නිසාම හිරුගේ ජායාව එයින් දිස් විය.මන්දු මඳක් එය වින්ඳා ය.

" තරූ මට ඇත්ත කියපන්, උබ කාත් එක්කද දැන් රෑට රෑට කතා කරන්නෙ ආ." මන්දු ක්ෂණික ව විමසූයේ ඇයට දීර්ඝ කාලයක් තිස්සේ පැවති පැනයකි.
තරූ පුදුමයෙන් මන්දු දෙස බලා හැඬීමට පටන් ගත්තා ය.

" අනේ මට සමාවෙයන් බං මං හිතලා කරේ නෑ , මම මේක උඹට කියන්න හිටියේ .මට බය හිතුණා බං .මං දන්නේ නෑ ඇයි කියලා .සමාවෙන්න මන්දුවෝ අනේ මාත් එක්ක තරහා වෙන්න එපා..."

තරූ හඬමින් ම සියල්ල පැවසුවා ය.සයාශ් යනු තමාගේ පෙම්වතා බවත් ඔහු විශ්වවිද්‍යාලයේ ආදි සොහොයුරෙකු බවත් හා ඔවුන්ගේ සම්බන්ධයට දැනට අවුරුදු 3 ක් වන බවත් ඇය පැවසුවා ය.

" ඒ කියන්නෙ එදා ඉදලා උබ සයාශ් අයියට ලව්... හාකො" මන්දු එසේ පවසමින් තරූ වෙත හෙලුවේ සැක මුසු බැල්මක්.

" අනේ බං මං දිහා ඔහොම බලන්න එපා.මට සමාවෙයන්.මං අයියත් එක්ක ඔයාට මේ ගැන කියන්න හිටියේ.එයා දැන් බදුල්ල හොස්පිටල් එකේ ඩොක්ටර් කෙනෙක්.අනේ ප්ලීස් තරහ වෙන්න එපා බං.මට බය හිතුණා උබ මට බනියි කියලා ඒකයි කිව්වෙ නැත්තේ අනික උබට කොහොමත් සයාශ් අයියාව පෙන්නන්න බෑනේ..". තරූ එක හුස්මට කියාගෙන යද්දී මන්දුට සිනාවක් නැඟුණි.

" මගේ මෝඩි..මේ අහනවා උබ මට මේ ගැන කියන්න කලින් මං මේ ගැන දැන ගත්තා.එදා අපි කැන්ටිමේ ඉන්නකොට මං දැක්කා සයාශ් අයියා එනවා, අයියා මාව දැකලා කතා කලා එතකොට එයා මේ ගැනත් කිව්වා.මට මේක උබේ කටින්ම පන්න ගන්නයි ඕනෙ වුණේ.හැබැයි මේකත් මතක තියාගනින් මං හැමදාම කියනවනේ උබ මට නංගි කෙනෙක් වගේ එතකොට මේ අක්කට නංගි ව තේරෙනවා ඒ නිස උබට මගෙන් මුකුත් හංගන්න බෑ හරිද මීට පස්සේ හංගලා

අහුවෙන්නත් එපා ..."මන්දු එය පැවසුවේ සොහොයුරියක් ලෙසින් නොව මවක් ලෙසින් ය.

"හා තරහ නෑ නේද මාත් එක්ක " තරූ කුඩා දරුවෙකු ලෙසින් ඉකි බිඳිමින් පවසන විට සැබැවින් ම මන්දු ට දැනුනේ ඇය පිළිබඳ ව අනුකම්පාවකි.

" මෙන්න මෙහෙ එනවා එළදෙන...ආදරයට වෙලාවක් ඔනේ නෑ බන් ඒක ඉබේම අපි ගාවට හොයාගෙන එනවා.ආදරයට සීමාවල් දාලා නවත්තන්නත් බෑ.ඒක හරියට අපේ හුස්ම වගේ . ඒක අපි හිතලා කරන්නෙ නෑනේ ඒවගේම තමා ඒක අපිට නවත්තන්නත් බෑ .හැබැයි අපිට ජීවත් වෙන්න ඒක ඕනෙමයි.දැන් අඬන්න බෑ හරිද ? අපි මෙහෙම කරමු මේ ලව් එකේ ප්‍රීතිය නිමිතිකොට ගෙන මිස් තරුනි ජයමාන්න ආහ් සොරි සොරි මිසිස් ෆොන්සේකා මට අයිස් ක්‍රීම් එකක් අරන් දෙන්න ප්ලීස්..." මන්දු තරූව බදා ගෙන ම එසේ පැවසුවා ය.

"පිස්සුද උබට කෑ ගහන්න එපා..මෙන්න මෙහෙ වරෙන්.."

"ආහ් මෙන්න වැඩක් මට බෑ මං එන්නෙම නෑ මට අයිස්ක්‍රීම් ඕනේමයි!!. උබ අරන් දෙන්නෙ නැත්නම් මං මේ දැන්ම සයාශ් මහත්තයට කතා කරලා කියනවා උබට එයාගෙන් බ්‍රේක් වෙන්න ඕනේ කියලා හාද..." මන්දු එක්වරම තරූ අත තිබූ ඇගේ ජංගමය ගෙන වෙරලේ දුවන්නට විය.

" ඒයි මන්දුවෝ ඕක මට දෙන්න..." තරූ ද ඇය පසුපසින් ඇදුණි .

දෙදෙනාම වෙරලේ දිව්වේ කුඩා දරුවන් ලෙසිනි.

" ඕහ් අනේ සොරි ..." මන්දු නතර වූයේ ඇගේ ඇඟෙහි කවුරුන් හෝ ගැටුනු නිසාවෙනි.

" හ්...රන්දිව් අයියා ඔයා...." මන්දු පුදුමයෙන් ඔහු දෙස බැලී ය.

"මන්දු කොහෙද මේ ...." රන්දිව් ද සිනහවකින් පැවසුවා ය.

"මං මේ මගේ යාළුවෙක් එක්ක පොඩ්ඩක් එළියට ආවා. ආහ් මේ ඉන්නේ සයාශ්, සයාශ් මේ ඉන්නේ මන්දු එතකොට අර ඉන්නෙ අපෙ නංගි තරූ .." රන්දිව් එසේ පවසද්දී මන්දු ට බැලුනේ තරූ දෙසය. ඇය සිටියේ තුෂ්නිම්භූත වූවෙකු ලෙසිනි.

" මචං මේ දෙන්නව ම මං දන්නවා මේ ඉන්නේ අපේ යුනියේ මං බයම එකී මේකිගෙ කට ලොකු යි ඇඟට වඩා.. " සයාශ් සිනහවෙන් ම මන්දු ගේ සායම යැව්වේ ය.

" එතකොට මේ ඉන්නේ මං දැන් ටිකකට කලින් උබට කියන්න ඕනේ කිව්ව කාරණාව.මේ මගේ ගර්ල්ෆ්‍රෙන්ඩ්." සයාශ් තරූ ව ළඟට ගෙන ඇගේ කරට අතකුත් දමා ගෙනම පැවසී ය.

" ඈ මොකක්..." රන්දිව් ගේ ඇස් තිබ්බේ නලලේ ....
මේ පැටලැවිල්ල ලිහා ගැනීමට අවැසි නිසාම සියල්ලෝම වෙරල ළඟ තිබූ අවන්හලකට ගියෝ ය.

" අපේ නගාත් බලනකොට නරකම නෑ ඩොක්ටර්ස්ලටනේ කෙලින්ම මායම දාන්නේ..." රන්දිව් නම් සිටියේ සතුටින් ය.මන්දු ත් නිහඬවම සයාශ් දෙසත් තරූ දෙසත් බලා සිටියාය

" ආහ් මං විතර ද ඔයත් එහෙමනේ...." තරූ එය පැවසුවේ මන්දු දෙසට ඇස් යොමු කරමිනි.

" ආහ් අහ් ඒ මොකක්ද ඒ මට උඹ එහෙම එකක් කිව්වෙ නෑනේ." සයාශ් ට මේ කිසිවක් තේරුම් ගත නොහැකි විය.

මන්දු සිටියේ රක්ත වර්ණයට හැරෙමිනි.ඇය රන්දිව් දෙසට යොමු වී තිබූ දෑස් වහා බිමට යොමු කලා ය.

" හ්ම් ඒත් ඒ පැත්තෙන් තාම නෝ රිඇක්ෂන් නේ මචං" රන්දිව් එසේ පැවසුවේ මන්දු දෙසට තම ඇස් යොමු කරමිනි.

තවත් පැයකට ආසන්න කාලයක් මුහුදු තීරයේ ගෙවා දැමූ ඔවුන් සැරසුණේ නික්ම යන්නටයි. සයාශ් සහ තරූ සිටියේ ක්ව නොහැකි සතුටකින්.සයාශ් මෙහි පැමිණ තිබුණේ තරූව බැලීමටයි.හෙට දිනයේ නැවත යෑමට සිදුවන බවත් තරූ ට කියූ ඔහු ඇය සමඟ මේ කාලය ගත කලේ මහත් සැනසීමකිනි. සිව්දෙනා ම විවිධ දේවල් කතාකරමින් සයාශ් ව ඇරලීමට දුම්රියපොළ වෙත ගියෝ ය.

" අනේ අද ඉඳලා යන්නකෝ ...." තරූ සයාශ් ඉදිරියේ පොඩි මුව පොව්වෙකු ලෙසින් එලෙස අයදිද්දී මන්දු ට සිහිවූයේ ඇගේ මව රෝශිනීවයි.ඇයත් තම පියා ඉදිරියේ මෙලෙස හැසිරෙන්නේ ඔහුගෙන් තව ආදරය බලාපොරොත්තුවෙනි. ආදරය යනු නිර්වචනය කල නොහැකි දෙයක් බව ඇයට වැටහුනි.

" මාත් ආසයි මෙන්න මෙහෙම පොඩ්ඩක් බදාගෙන තුරුළු වෙලා ඉන්න .ඒත් බෑනේ මැණික වැඩ තියෙනවා ඉන්නම බැරි

නිසයි, මේ ආවේ .මං ආයේ ඉක්මනින් එන්නම්කෝ හ්ම් ..."
සයාශ් එසේ පවසමින් තරූ ගෙ නලළත සිම්බේය .

"මොනාද බං අපි වගේ පොඩි ළමයින් ව නරක් කරන්න
එපා.."රන්දිව් සිනා සෙමින් සයාශ් ට පැවසුවා ය.

" අනේ උබේ පොඩිකම මං කියන්නෙ නෑ.. ...මන් යන්නම්
එහෙනම් නංගි පරිස්සමින් ඉන්න ...." සයාශ් මන්දුටත්
රන්දිවටත් සමුදී දුම්රිය වෙත ඇදුනේ ය.

ඔහු එක් වරම දිව ඇවිත් තරූගේ කම්මුල් පෙති සිම්බේ
ඇයව හැරයාමට ලෝභ බව පෙන්වමිනි.

"අනේ අම්මපා බං උබ නම් ඇති යකෝ ඉතුරු ටික බැන්දට
පස්සේ continue කරපන් නැත්තං කාන්තා දූෂණ කියලා
මිනිස්සු අල්ලලා හිරේ දායි.." රන්දිව් ගේ විහිලු නම් දැන්
ගානට වැඩී ය.

" හරි හරි මං යනවා බායි...." සයාශ් ඔවුන් අත වනමින්
දුම්රියට ගොඩ වුණි.

බෝඩිමට පැමිණියද තරූ සිටියේ දුකෙනි.ඇය සයාශ් ට
බෙහෙවින් ආදරය කලාය.නමුත් ඇය වෛද්‍යවරයෙකුගේ
වගකීම් ගැන හොඳාකාරවම දන්නී ය.එබැවින් ඇය සිත හදා
ගත්තා ය.

කාලය ගෙවී ගියේ මන්දගාමීව ය.මන්දුගේ අයියා ගේ
විවාහය ට දින නියම විය.තව මාස දෙකක පමණ කාලයක්
ඉතිරිව තිබුනද තවත් කර්‍යයන් රාශියක් කිරීමට තිබුණි.

මන්දු සිටියේ කල්පනාවක.තරූ පැමිණියේ ඇයට තේ කෝප්පයකුත් රැගෙන ය.
"මොකද අද කෙල්ල සයිඩ් වෙලා ආ" මන්දුගේ උරහිසට තට්ටුවක් දාමින් ම ඇය තේ කෝප්පය මන්දුට පිදුවා ය.

" අනේ නෑ බං නිකන් මේ අයියලාගේ වෙඩින් එක ගැන හිත හිත හිටියේ ." බොරුවක් නිසා මන්දු එය පැවසුවේ තරූගේ දෑසට හොරෙන් ය.සත්‍ය නම් ඇය කල්පනා කලේ ඒ රුව ගැනයි.දිගැටි දෑස් , ඔහුටම ආවේණික වූ සුන්දර සිනහව, වශී කරන්නා වූ වාග් විලාසය ...... හ්ම් ඔව් " රන්දිව් " නොදැනීම මන්දුගේ හදවත ඔහු වෙනුවෙන් ගැහෙන්නට අරගෙන.

" අඩේ ඔව්මයි නේ ලොක්කයියා බඳිනවා ....හ්ම් මට හිතා ගන්න පුලුවන්.උබට දුකයි නේ.එහෙම තමා බං ඉතින් කාලය මැව් වෙනසක අරුමේ.මේ ඒක නෙමෙ එදාට ශෙනායා අක්කා ඉඳියි ආයේ ආලියා බාට් වගේ නේද" තරූ දිගටම කියවාගෙන ගියේ ඇගේ සැබෑ සිතිවිලි වටහා නොගෙනය.

" හ්ම් ඔව් බං . ඒක නෙමේ බං මට හිතා ගන්න බැරි උබේ මේ ටකරං කටට අර මනුස්සයා කොහොම කැමති වුනා ද කියලා." මන්දු කතාව වෙන පැත්තකට හැරෙව්වේ හිතා මතාමයි.

" ඒක ඉතින් අහන්න ඕනේ සයාශ් ගෙන්ම තමා."

" අම්මේ දැන් අයියා කෑල්ලත් හැලිලා නේ.තවටික දවසකින් මොනවා හැලෙයිද දන්නේ නෑ..." මන්දු සම්ච්චලයට මෙන් පැවසුවා ය.

" බය වෙන්න එපා සුදූ මං උබව හලන්නේ නෑ..." තරූ එසේ පවසමින් ම මන්දුගේ කම්මුල් පෙති සිම්ඹා ය.මන්දු ද ඇයව එලෙසම සිඹ ගෙතුලට යන්න පිය මැන්නා ය.

"ආහ් බං මට උබට දෙයක් කියන්න තියෙනවා .." තරූ එය පැවසුවේ නම් මීට සුළු මොහොටකට පෙර මුහුණේ තිබූ සිනහව ඉවත් කරමින් ය. මන්දු තිගැස්සී ඇය දෙස බැලීය.තරූ නැඟිට ඇය වෙත ආවේ සීරියස් මුහුණක් මවා ගෙනය.

" උබට පුලුවන් ද........මගෙ කෝප්පෙත් හෝදන්න." තරූ ක්ෂණිකවම තේ කෝප්පය මන්දු අතට දී ගෙතුලට දිව්වේ ඊළඟට සිදුවන දෙය අනුමාන කරමිනි.

"තෝ නම් බං හිකනල් හරක් පැටියෙක්..." මන්දු තමාටම සිනාසෙමින් තරූ ට බැන වැදුනා ය.

එදින හවස නොසිතූ ලෙස තරූ ට ඇමතුමක් හමුවූයේ ඇගේ මව අසනීපයෙන් බවයි.එනිසා හෙට දින උදෑසනම තරූ ගමට යෑමට තීරණය කලා ය.මන්දු කොපමණ ඇයට තමා ද මේ ගමනට සහභාගි වන්නම් යැයි පැවසුවද තරූ කියා සිටියේ තමාට එහි තනිවම යා හැකි බවත් මන්දු නිකරුණේ ඇය වෙනුවෙන් නොආ යුතු බවත් ය.

පසුදින උදෑසනම තරූ ආදාළ බස් රථයේ නැඟ ගමට පිටත් වූයෙන් මන්දු බෝඩිමේ තනි විය. තම කාමරය පිලිවෙළක් කර ඇය සැරසුණේ දහවල් ආහාරය පිසීමටයි. තරූ නැති නිස ඇය ට ආහාර පිසීමද මඟක් කම්මැලි විය.පසුව එයද අතැර මිදුලෙහි බංකුවක් වෙත ආවේ ඇය කියවමින් සිටි

නවකතාවද රැගෙනයි. ඇය එහි පිටකවරය දෙස බැලී ය.එහි දිස්වූයේ කඩවසම් පිරිමි රුවකි. මඳක් ඔහු ට වශී වී සිටි ඇයට කෙටි සිනාවක් පහල වූයේ නොදැනුවත්වමයි. මේ සිතිවිලි අතර සක්මන් කලේ ඒ රුවයි. " රන්දිව් ". ඇය නොදැනුවත්ව ම ඔහුව ඇගේ සිතිවිලි වලට ඇදා ගනියි.

" මං රන්දිව් අයියට කැමතියි ද අනේ මන්දා මට තේරෙන්නේ නෑ මොනව වෙලා ද මට.ඒත් එයාට එහෙම නැතුවැති .මං විකාර හිතනවා." හිත සමඟ සංවාදය නතර කරන්නට වූයේ ජංගමයේ නාදය කන් පුරා යද්දීයි.

" ශෙනායා අක්කේ කියන්න..." මන්දු පොත වසමින් දුරකථනය කනේ තබා ගත්තේ සිනහවෙන්මය.

" නංගි බෝඩිමේ නේද ....ඊයේ තරූ යනවා කිව්වනේ මට හිතුණා ඔයා පාලුවෙන් ඇත්තේ කියලා ඒකයි ගත්තේ පොඩි චැට් එකක් දාන්න.." ඇයද සිනහවෙන්ම පිලිතුරු දුන්නාය.

මන්දු ට ශෙනායා පිළිබඳ ඇති වූයේ ආදරයකි.මෙවැනි නෑනා කෙනෙකුන් ලබන්නත් ඇය පිංවන්ත බව මන්දු සිතුවා ය.

" හ්ම් ඔව් අක්කේ ඔයා කතා කරපු එක හොඳයි. මාර කම්මැලිකමකින් හිටියේ.." එලෙස තවත් විනාඩි කීපයකට ඒ ඇමතුම දීර්ඝ විය.

" හරි අක්කේ බායි බුදුසරණයි ...පරිස්සමින් ඉන්න " මන්දු ඇයට එලෙස සමුදී ඇමතුම විසන්ධි කරනවාත් සමඟ කවුරුන් හෝ දොරට තට්ටු කරනවා ඇයට ඇසුණි.
දොර විවර කළ ඇය අදහා ගත නොහැකි ව තම ජංගමය

දෙසත් පැමිණ සිටින පුද්ගලයන් දෙසත් මාරුවෙන් මාරුවට බැලුවා ය.

" අයියා...අක්කා .. මෙ ඔයා ලා..." මන්දු ට ගොත ගැහුනේ ලොකු සහ ශෙනායා අක්කා ඇගේ ඇස් ඉදිරිපිට සිටිනවා දැකීමෙනි.

" හැමදාම ඔයානේ අපිව පුදුම කරන්නේ.ඔන්න අද අපි ගානේ රිටන් එක." මන්දුල් එසේ පවසමින් ම බෝඩිමට ගොඩ වුවා ය.

" ඉතින් කොහොමද පැටියෝ " ශෙනාය අක්කා මන්දුව වැලද ගනිමින් ඇගේ කම්මුල් මිරිකුවා ය.

" මට නම් හිතා ගන්නවත් බෑ ඔයාල..මේ..කොහොමද " මන්දු සිටියේ තවමත් පුදුමයෙනි.පසුව සියලු දෙනාම සාලයේ සිට අල්ලාප සල්ලාපයේ යෙදී ය. එහි ප්‍රධාන මාතෘකාව වූයේ තරූ ගෙ පෙම්වතා ය.

" ඇත්තටම නංගි තරූ ඒ අතින් නම් මාර ලකී සයාශ් හොඳ කෙනෙක් වගේ .." ශෙනායා එසේ සයාශ් පිළිබඳ පැහැදී කතා කරන විට මන්දුගේ හිත ගියේ රන්දිව් සොයා ය. ඇය නැවත සිතිවිලි ලෝකයක අතුරුදන් විය.

"ශෙනායා අපේ මන්දුගේ වෙනසක් ඔයාට පෙන්නේ නැද්ද " ලොකු ඇස් පුංචි කරමින් එසේ පවසද්දී ඔහුව අනුගමනය කරමින් ශෙනායා ද මන්දු දෙස එලෙසම බැලී ය.

" හ්ම් ඔව් මන්දුල් කෙල්ල ටිකක් සයිලන්ස් වෙලා වගේ.."

" අනේ එහෙම නෑ අක්කේ අයියාට පිස්සු .දැන් ඔයාලා ආවේ වෙඩින් එකට බඩු ගන්නත් එක්කනේ.එහෙනම් ඉන්න මං ඉක්මනට ලෑස්ති වෙලා එන්නම්.අපි යමු ." මන්දුල් ද ශෙනායා ද හිනා වෙන අතරේ මන්දු දිව්වේ සුදුසු ඇඳුමක් දා ගැනීමට ය.

මඳ හෝරා කීපයකට පසු කොළඹ පිහිටි ප්‍රධාන සාප්පු සංකීර්ණයකට ඔවුන් පිවිසියේ ලොකුගෙ විවාහයට අවශ්‍ය බඩු මිලදී ගැනීමට ය.නෙක නෙක විසිතුරු දේවල් වලින් සියලු මහල් පිරී ඉතිරී ගොසින් ය.ශෙනායාත් සමඟ මන්දු කාන්තා ඇඳුම් තිබෙන ප්‍රසිද්ධ සාප්පුවකට ඇතුළු විය.

" නංගි ලස්සන ද මේක." ශෙනායා දිගට කඩා හැලෙන ගවුමක් මන්දුට පෙන්වීය.

" ඒත් අපේ අයියා නම් කැමති අර ගවුමට වගේ අක්කෙ " මන්දු සිනාවෙමින් ශෙනායා ට පෙන්වූයේ ඉන්ඩිගෝ පැහැති අලුත්ම විලාසිතාවක ගවුමක හැඩ බලමින් සිටි මන්දුල්වයි.

" ඒයි මොකද ඔයා ඒකට කැමති ද..." ශෙනායා මන්දුල් ගේ අත මිරිකමින් ඇසුවේ ඔහු ගැස්සෙන විටය.

" හ්ම් මේක ගන්න .මේක මැච් වෙනවා ඔයා ට."

මන්දුට නොදැනීම ඇගේ සතුටු කඳුලක් ඇස් කොනට ඉනුවේ ලොකුගේ ත් ශෙනායාගෙත් ආදරය දැකීමෙනි.පසුව සියලු දෙනාම විවිධ සාප්පු වලට ගොස් අවශ්‍ය බඩු මිලදී ගත්හ. අවසානයේ ඔවුන් තීරණය කලේ දහවල් ආහාරය ද ගෙන නැවත යාමටයි.

" ශෙනායා මං චොශ්රූම් එකට ගිහින් එන්නම්" ලොකු ගියේ සිය අවශ්‍යතා ඉටු කර ගැනීමටයි.

"නංගි මේ බලන්න මට හම්බුන කෙනා..." මන්දුල් සමඟ සිනා සෙමින් පැමිණෙන පුද්ගලයා දැක මන්දු පුදුම වුණා පමණක් නොව ඇගෙ මුලු ගතව පොලොවට ඇලී පවතිවාක් මෙන් ඇයට දැනුනි.

" අනේ දෙයියනේ රන්දිව් මල්ලි දැක්ක කල්..." ශෙනායා අක්කා ඔහු වෙතට ගියා ය.මන්දු තවමත් හුන් තැනම සිටියාය .

" කොහොමද අක්කේ...මොකො මෙහේ." රන්දිව් ශෙනායා අක්කාගෙන් විමසුවද ඒ දෑස් මන්දු වෙතටයි.

" අපේ වෙඩින් එක නෙක්ස්ට් මන්ත් ඒකට අවශ්‍ය බඩු වගයක් ගන්න කියලා ආවේ මල්ලී. ඉතිං මල්ලි මොකෝ මෙහෙ ගර්ල්ෆ්‍රෙන්ඩ්වත් බලන්න ආවද." ලොකු ඔහුට යොමු කල ප්‍රශ්නයෙන් රතු වූයේ රන්දිව් නොවේ මන්දු ය.

" මොන කෙල්ලොද අයියේ...මෙහෙ තව ෆ්ලෝ එකක් හදනවනේ.ඒක තමා අපේ අලුත් ප්‍රොජෙක්ට් එක මං මේ ඒකේ වැඩ ටික බලන්න ආවා." රන්දිව් ගේ පිලිතුර මන්දු සැනසුවේ ය.

" ආ එහෙමද...හොඳයි හොඳයි. ඒක නෙමේ අපි දැන් මේ ලන්ච් එක ගන්න යන්න බැලුවේ.මල්ලිටත් අපිත් එක්ක එන්න පුලුවන් .මල්ලි ෆ්‍රී ද දන්නේ නෑ ඒත්." ලොකු ගේ යෝජනාවට කැමැත්ත දීමට පෙර රන්දිව් කාටදෝ ඇමතුමක්

ගෙන " මං යනවා වැඩ ටික බලන්න" යැයි පැවසුවේ ය.

" හරි අයියේ යං මාත් එන්නම්.හැබැයි අද ලන්ච් මං ගානේ.."

"අනේ මල්ලි පිස්සු ද ඔයා එන එකම ලොකු දෙයක් නේ." ශෙනායා අක්කා දයාබර ලෙස පවසද්දී රන්දිව් මද සිනාවක් මන්දු ට පෑවේ ය.

" නෑ නෑ අක්කේ ප්ලීස් මේක මගෙන් ප්‍රී වෙඩින් ගිෆ්ට් එකක් කියලා හිතන්නකෝ." රන්දිව් එසේ පවසමින් සියලු දෙනා සමඟ සාප්පු සංකීර්ණයෙන් පිට විය.

" නංගි ඔයා මල්ලිත් එක්ක එන්න.එයා තනියෙන් නේ.මං අක්කා එක්ක පිටිපස්සෙන් එන්නම්." ලොකු එහෙම කියද්දි රන්දිව් ගේ හිතේ ඇඳුනේ ජයග්‍රාහී සිනහවක්.

පසුව රන්දිව් ගේ ෆිට් වර්ගයේ මෝටර් රථයට නැගි මන්දු පැති කණ්නාඩිය දෙස බැලුවේ ලොකු පැමිණෙනවා ද කියා යි.

" බයවෙන්න එපා මං ඔයාට අතවර කරන්නේ නෑ." රන්දිව් ගේ විහිලුවට මන්දුගේ මුවේ ඇඳුණේ සිනා රැල්ලකි.

" අයියා අක්කට හරිම ආදරෙයි නේද මන්දු "

" හ්ම් ඔව් අයියේ මං අපේ අප්පච්චිට පස්සේ දැකපු ලස්සන ම ආදරවන්තයා අපේ අයියා " මන්දු රන්දිව් සමඟ ටිකෙන් ටික විවෘත වීමට පටන් ගෙන තිබුණි.මන්දු ට සැබැවින් රන්දිව් අසල සිටින විට දැනෙන්නේ සැනසීමකි.ඔහු දකින වාරයකදීම ඇය සිටියේ ඒ මොහොත උපරිමයට විඳිමින් ය.

මන්දු නොදන්නා හැඟීම් සමුදායක් හිත තුල සක්මන් කරද්දි ඇය සිටියේ ඒ හැඟීම් වල අර්ථ සොයමිනි.

"  එහෙම වෙන්න ඕනෙ මන්දු .මං දන්න තරමින් කෙල්ලෙක්ට එයාගේ අයියා තමා හැමදේම ඒ කෙල්ල එයාගෙ අප්පච්චිගේ ප්‍රතිරූපේ දකින්නේ අයියාගෙන්."

" ඉතින් අයියාත් අයියා කෙනෙක් නෙ." මන්දු හුරතල් ලෙසින් රන්දිව්ගෙන් ප්‍රශ්න කලා ය.ඇය නොදැනුවත්වම ආදරය ඉදිරියේ ඇයද තරූ මෙන් හුරතලියක් වී අවසන් ය. රන්දිව් මඳක් ඒ හුරතලිය  දෙස බලා සිටියේ ය.

" මට ඉන්නේ මල්ලි කෙනෙක්නේ මන්දු "

" අයියා දන්නවා ද මල්ලි කෙනෙක්ට අයියා කෙනෙක් කියන්නෙ එයාගේ තාත්තා වගේ. ඒ මල්ලි කවදාවත් අයියාගෙන් තාත්තා ගෙ ප්‍රතිරූපේ බලාපොරොත්තු වෙන්නෙ නෑ. එයා බලාපොරොත්තු වෙන්නෙ තමන්ගේ තාත්තාවමයි.ඒ රැකවරණයමයි.තාත්තා කෙනෙක්ට කියන්න බැරි ගොඩක් දේවල් බෙදාගන්නෙත් ඒ අයියා එක්කමයි." ගැඹුරු ස්වරක් මන්දුගෙ මුවට ආවේශ වෙද්දී රන්දිව් කුහුලින්ම ඇය දෙස බලා සිටියේ ය.ඔහුගේ දෑස් තුල නලියන කදුලු බිංදුව මන්දු දුටුවේ එවිටයි.

" මන්දු ... මෙච්චර දේවල් දන්නේ කොහොමද "රන්දිව්ගේ කටහඬ එන්න එන්නම දයාබර වෙද්දී මන්දුගේ සිත පිරී ගියේ තවත් නැවුම් වූ හැඟීම් පොදි බැදගෙනයි.

" ආදරය නිසා අයියේ ..." මන්දු එක එල්ලෙ යොමු කල පිලිතුර

රන්දිව් ගේ සිත ගැස්සීමට සමත් විය.

" ඒ කිව්වේ.." ඒ කිසිවක් නොපෙන්වා ඔහු ඇගෙන් විමසුවේ ඒ දෑස් වලට එබෙමින් ය.

" මං හැදුනේ වැඩුනේ ආදරෙත් එක්ක අයියේ.මගේ අම්මා අප්පච්චි ,අයියා එක්ක. මං එදා ඔයාලගේ ගෙදර ආවහම මං ඒ හැමදේම දැක්කා.එදා ඔයා ඔයාගේ මල්ලි ට තාත්තාට දක්වපු ඒ ආදරය මට තේරුම් කෙරෙව්වා අයියේ අයියා කෙනෙක් කියන්නේ මොන වගේ කෙනෙක්ද කියලා.ඒක වෙනස් වෙන්නෙ ගැහැණු පිරිමි භේදය හින්දා විතරයි." මන්දු තවදුරටත් දැනමුත්තියක් සේ කියවාගෙන යද්දී රන්දිව් ට ඇතිවූයේ ඇය පිළිබඳ අනුකම්පාවකි.

කිසිවක් නොකියා රන්දිව් ඉදිරියට ගමන් කලේ ඔහුගේ සිතද මේ වනවිට හැඟීම් තදබදයකට ලක්වී ඇති නිසා ය.ඔහු සැනසීමට හැකිවූයේ මන්දු ට පමනි.දෙදෙනාම තව බොහෝ දෑ කතා කරමින් දහවල් ආහාරය සඳහා අවන්හලකට පැමිණියහ. ලොකු ත් ශෙනායාත් ඔවුන්ව අනුගමනය කරමින් පාරේ අනෙක් පසම මෝටර් රථය නැවැත්වි ය. වාහන සී සී කඩ පාර පුරා දුවද්දී හතර දෙනාම තැත් කලේ පාර මාරු වීමටයි.අනවසරයෙන් ම මන්දු ගේ හස්තය රන්දිව්ගේ ග්‍රහණයට ලක් වෙද්දී මන්දු තිගැස්සුනේ ඒ පහස හදවත කම්පා කර බැවිනි.

අවන්හලේ සිට නොයෙකුත් දෑ කතා කරමින් ආහාර ගනිමින් ඔවුන් සතුටු විය.

" අයියලා අදම යනවද" මන්දු ඇසීමට නොහැකි වූ ඒ පැනය

විමසුවේ රන්දිව් ය.

" ඔව් මල්ලි යන්න ඕනේ තව වැඩ ටිකක් තියෙනවා කරගන්න."

" මටත් එන්න වෙයි අයියේ කොහොමත් .අපේ මල්ලි එක්සෑම් ලියනවනේ මේ පාර" රන්දිව් බැලුවේ මන්දු දෙසයි. ඒ දෑස් ක්ෂණිකව විසල් වූයේ රන්දිව්ගේ මුවට සිනාවක් ගෙන දෙමිනි.

" ආහ් ඔව්නේ.මේ පාර නේ"

තවත් විනාඩි කීපයකට පසු සියලු දෙනා සැරසුණේ විසිර යන්නයි.

" නංගි අපි එහෙනම් ගිහින් එන්නම් පැටියෝ ඔයා ඉක්මනට එන්නකෝ..." ශෙනායා මන්දුව වැළඳ ගෙනම පැවසුවේ සෙනෙහෙබරවයි.

" චූටි අපි ගිහින් එන්නම් ඔයා මල්ලි එක්ක එහෙනම් පරිස්සමින් ආපහු බෝඩිමට යන්න.කොහොමත් අනිද්දා එනවනේ.පරිස්සමින් එන්න එහෙනම්.මං කෝල් එකක් දෙන්නම් ගියහම" ලොකු වැඩිහිටියෙකු සේ පවසද්දී මන්දු ඔහුට දණ ගසා වැන්දේ රන්දිව් පැවසූ දේ සිහිකරමිනි.

" එහෙනම් මල්ලී උබට ආයේ වෙනම ඉන්වයිට් කරන්නෙ නෑ.පරිස්සමින් එන්න.දෙන්නත් එක්ක හිමීට යන්න වෙලා තියෙනවා නේ" මන්දුල් රන්දිව් වැළඳ ගනිමින් පැවසුවේ ලෙන්ගතුවය.ටික කාලයක් වුවද ඔවුන් ඉක්මනින් ලං වී ඇති

බව මන්දු වටහා ගත්තා ය.

අයියා සහ අක්කා ට සමුදී ඔවුන් සැරසුණේ ආපසු යන්නටයි. යන අතරමඟ රන්දිව් රථය නැවතුයේ ගාලු මුවදොර වෙරළ තීරය අසලයි.

" ඇයි මේ" මන්දු ඇසුවේ පුදුමයෙන් ය.

" කොහොමත් බෝඩිමට ගියාම පාලුයිනේ එන්න පොඩ්ඩක් ඇවිදලා යමු " රන්දිව් රථයේන් බැස ඇයට බැසීමට දොර විවෘත කලේ ය.

දෙදෙනාම වෙරළ තීරයේ සුළං රැල් විඳිමින් ඇවිද ගියේ නිහඬවය.

" මන්දු " රන්දිව් නිහඬ බව බිඳිමින් මුව විවර කලේ ය.

" ම්ම්.." රැළි පිට රැලි නඟන ඒ වෙරලේ සෞම්‍ය හඬට කන් දීගෙන ම මන්දු රන්දිව් ට ප්‍රතිචාර දැක්වුවා ය.

" හෙට මගේ බර්ත් ඩේ එක."

" ආ. එහෙමද ඔයා මට කිව්වෙවත් නෑනේ කලින්" මන්දු බොරු තරහකින් රන්දිව් ට පැවසුවා ය.

" හ්හා. කලින් කියලා ඉතින් ඔයා මොනා කරන්න ද" රන්දිව් ගේ සිනහවෙන් පිරි ඒ විහිලුව මන්දු ගේ සිත බින්දේ ය.

" හ්ම් ඔව් නේ"

" අයියෝ හරි හරි විහිලුවක් කලේ අනේ.මූණ එල්ල ගන්න එපා.ඒක මන්දු ට ගැලපෙන්නේ නෑ." රන්දිව් උත්සාහ කලේ වෙච්ච වැරැද්ද නිවැරදි කිරීමටයි.නමුත් මන්දු ගේ මුහුණෙහි වෙනසක් නොවී ය.

" හරි එහෙනම් බඩඉරිඟු කන්න යමු ද ." රන්දිව් ඇගේ මුහුණට එබෙමින් පැවසුවේ මන්දු ගේ සිනහව නැවත ඇගේ මුව සරසද්දීයි.

" මේ කෙල්ලත් ඉතින් කෑමක් කිව්වොත් තරහ පැත්තක නේ.අර අයියලා ආපු වෙලාවේ බලන්න එපැ හරිම ශාන්ත විදියට කෑවේ." රන්දිව් එක දිගට ඇයට විශේෂණ පද එකතු කලේ ය.

" එහෙම තමා ඉතින් ගෑනු ලමයි " මන්දු එසේ පවසමින් රන්දිව් පසු කරගෙන ගියේ බඩඉරිඟු විකුණමින් සිටි කුඩා මඩුව අසලටයි.

රන්දිව් මන්දුටත් තමාටත් බඩඉරිඟු මිලදී ගෙන අසල ඇති බංකුව මත වාඩි විය.බඩඉරිඟු කරලක් මන්දුට දිගු කල ඔහු එය දැඩි පෙරේතකමකින් ආහාරයට ගන්නා මන්දු දෙස බලා සිටියේ ය.

" එතකොට ඒ ගෑනු ලමයි බඩඉරිඟු කන්නේ මෙහෙමද."
රන්දිව් සිනාසෙමින් මන්දුගේන් විමසුවේ ය.

" බඩඉරිඟු කියන්නේ මගේ ඕල් ටයිම් ෆේවරිට් කෑමක් "
මන්දු ද කන එක නොනවත්වාම ඔහුට පිලිතුරු දුන්නා ය.

" අප්පා එහෙනම් ඉස්සරහට මට බඩඉරිඟුම අරන් දිදී තමා ඉන්න වෙන්නේ" රන්දිව් තම සිතිවිලි වලට පැවසුවේ තමාටම සිනාසෙමිනි.

දෙදෙනාම හෝරාවන් කිහිපයක් වෙරලේ ගෙවා දමා නැවත බෝඩිමට පැමිණියෝය.

" එහෙනම් මන්දු පරිස්සමින් ඉන්න. හෙට මන්දුල් අයියාට මොනා හරි ගන්න යන්න හිතන් ඉන්නේ.යන්ද මාත් එක්ක එහෙනම්." රන්දිව් හෙට දිනටයට ඇයගේ පැමිණීම බලාපොරොත්තුවෙන් විමසුවේ ය.මන්දු තම හිස දෙපසට වැනුයේ "හා" කීමට යි.නමුත් ඇගේ මුව ගොලු වී තිබුනේ ඇයිද යන වග ඇයට ද එක් කලේ පැනයකි.

මන්දු ඉක්මනින් පිරිසිදු වී ඇඳට පැමිණියේ අද දවසේ කල්පනා කිරීමට බොහෝ දෑ ඇයට ඇති නිසාවෙනි. තමා අද රන්දිව් සමග ගත කල කාලය පිළිබඳ ඇය සිටියේ ඉමහත් සතුටකිනි.ඇයට මීට පෙර නොදැනුනු හැඟීම් සයුරක කිමිදෙමින් තම සිහින ලෝකයේ සැරිසැරුවේ එම හැඟීම් තවත් වර්ණවත් කරමිනි. මන්දු ට දැනුනේ සැනසීමකි.රන්දිව් යනු තම අයියා තරම් කෙනෙකුන් වුවද ඒ මුහුණාත දෙස කෙලින් බලන සෑම අවස්ථාවකම ඇයට එම සොහොයුරුකමට එහා තිබෙන දෙයක් පෙනෙන්නට විය.නොදැනීම රන්දිව් ට පෙම් බඳින ඇය එම හැඟීම පිලිගැනීමට බිය විය.

" රන්දිව් අයියා ගොඩක් හොඳ කෙනෙක්.එයා මං වගේ කෙනෙක් ට කැමති වෙන්නේ නෑ කොහොමටවත්. ඒත් අනේ මන්දා."

පසු දින උදෑසනම ඇය සූදානම් වූයේ රන්දිව් හමුවීමටයි.තම අයියාගෙන් ලද උපන්දින තෑග්ගක් වූ ඇගේ ප්‍රියතම ලා රෝස පාට ගවුම ඇඟ ලා ගත් ඇය පිළිවෙළට කොණ්ඩය සකස් කලාය. අද දින රන්දිව් ගේ උපන්දිනය බැවින් ඇය ප්‍රථමයෙන් ම ඔහුට තෑග්ගක් මිලදී ගැනීමට ගියා ය.

විවිධ විලාසිතාවන්ගෙන් ඔප් නංවා ඇති නවීන පන්නයේ කමිස ලෝකයක අතුරුදන් වූ ඇය, තම හිතේ මිම්මට රන්දිව් ට ගැලපෙන සරල මෝස්තරයක් වුවද ආකර්ෂණීය පෙනුමක් සහිත කමිසයක් මිලදී ගත්තා ය. වෙළෙඳසැල් සේවකයා ලවා එය ඇසුරුම් කරගෙන ඇය එයින් පිට වෙනවාත් සමඟ රන්දිව්ගෙන් කෙටි පණිවිඩයක් ඇයට ලැබුනි.

" මං ආවා ඔයා කොහෙද මන්දු "
" ඉන්න මං ළඟ ඉන්නේ 😊 " යනුවෙන් ඔහුට පිලිතුරු යැවූ ඇය ඉක්මනින් රන්දිව් සිටිය අවන්හලට ගියා ය.

" ඔයා අද ලස්සනයිනේ.." රන්දිව් සැබැවින් ම ඇගේ සුන්දරත්වය අගය කලේ ය. තම හමේ පැහැයත් සමඟ කරට කර ගැටෙන ඒ ගවුමේ පාට සැබැවින් ම මන්දු ට එක් කලේ ඇගයිය යුතු සුන්දර බවකි.

" තැන්ක්‍යූ අයියේ .ආහ් මේක ඔයාට විෂ් යූ අ වෙරි හැපි බර්ත් ඩේ " මන්දු හුරතලෙන් රන්දිව් ට සුබ පැතුවෙ හා පැටියෙකු ලෙසිනි.

" තැන්ක් යූ ටූ මන්දු " සුන්දර සිනහවකින් රන්දිව් එය පිලිගත්තේ ය.

කෝපි කෝප්පයක් රස විඳිමින් සිටි මන්දු දෙස රන්දිව් බලා සිටියේ ආදරණීය ලෙසිනි. තම හැඟීම් නිදහස් කර ගැනීමට අද දිනය යොදා ගන්නවා යැයි සිතූ ඔහු කතාවට මුල පිරුවේ ය.

" මන්දු මට ඔයාට දෙයක් කියන්න තියෙනවා "

මන්දු කෝපි කෝප්පය මේසය මත තබා ඔහුට ඇහුම්කන් දීමට සැරසුණි.

" මන්දු මං ඔයාට ගොඩක් කැමතියි." රන්දිව් එක්වරම පැවසූ දෙයින් මන්දු අතරමං විය.තමාගේ හද ගැස්ම කෝච්චියක වේගයෙන් ගමන් කරද්දී ඇය නොසිතූ නමුත් පැතූ දෙයක් සජීවීව ඇය ඉදිරියේ සිදුවෙමින් පවතී.

" ඔව් මන්දු මං ඔයාට කැමතියි. මගෙ ජීවිතයේ මට කෙල්ලෝ හම්බ වෙලා තියෙනවා ආශ්‍රය කරලත් තියෙනවා ඒත් මට ෆීල් වෙච්ච එකම කෙල්ල ඔයා. ඔයා අපේ ගෙදර ආපු දවසේ මගේ හිතට මොකක්ද අමුතු හැඟීමක් දැනුනා.පස්සේ මං ඒ හැඟීමට ඇබ්බැහි වුණා. මං මේක විශ්වාස කලේ නෑ ඒත් මං දන්න විදියට ඒකට කියන්නේ ආදරය කියලා.ඔයා ගොඩක් සිම්පල් ගෑනු ලමයෙක්. ඒ වගේම හරිම නැචුරල් ඒකයි මට ඔයා ගැන කැමැත්තක් ඇති වුණේ.මට මේක ඔයාට කියන්න ඕනෙ වුනේ එදා නිවාඩුවෙන් පස්සේ ඔයාව බෝඩිමට ඇරලවද්දී. ඒත් එදා මං ඉවසුවා මට බය හිතුනා ඔයා බෑ කියයි කියලා. ඒත් මන්දු මං ආසයි ඔයාව මගේ කරගන්න.කවදාහරි දවසක මගේ වයිෆ් කරගන්න. මගේ ජීවිතයේ ඉතුරු ටික ඔයත් එක්ක ගත කරන්න. මං දන්නවා ඔයා දැන් බයවෙලා ඉන්නේ.මම දැන් ම මුකුත් ඔයාගෙන්

බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒත් ප්ලීස් වැඩිය කල් ගන්න එපා.ඔයා මට කැමති නම් කෙලින් කියන්න."
රන්දිව් ඈය ඉදිරියේ සිංහයෙකු මෙන් තම ආදරය ප්‍රකාශ කරද්දී මන්දු ගල් වුවෙකු මෙන් ඔහු දෙස බලාගෙන සිටියි.

ඇයද ඔහුට පෙම් කරන බව හදවත කොපමණා හඬ නඟා කීවත් ඇයගේ මුවින් එකදු වචනයක් හෝ පිටනොවීමට ඇය වගබලා ගත්තාය.තම උගුරු දණ්ඩේ සිරවී ඇති හැඟීම් ගුලිය එයට ඉඩ නොදුන්නේ ය. තව මොහොතක්වත් එහි රැඳීමට අපහසු වූ බැවින් ඇය රන්දිව් ට පැවසුවේ තමා ට නැවත යා යුතු බවයි. දෙදෙනාම තම හැඟීම් වලට වහල්ව මුනිවත රැක්කෝ ය. ජනේලයෙන් එපිටට වත හරවා ගෙන හැඟීම් සාගරයෙන් නියම පිලිතුරු සොයමින් සිටි මන්දු නැවතත් පියවි ලෝකයට පැමිණයේ රන්දිව් ගේ ගැඹුරු පුරුෂ ස්වරයෙනි.

" මන්දු බෝඩිමට ආවා " එසැනින් රථයෙන් බැසගත් මන්දු ගේට්ටුව අසලට දිව ගියාය.

" මන්දු ඔහොම ඉන්න " රන්දිව් ගේ හඬට ගැස්සී ගිය ඈය වහා නතර විය.ඈගේ අසලට සෙමෙන් ඇදෙන රන්දිව් දෙස මන්දු බලා සිටියේ බියෙනි. නමුත් ඈ අසලට විත් ඈගෙ නලලත මත සියුම් සිපුමක් තැබූ රන්දිව් ඈගේ කම්මුල් පෙත්තකද තම ආදරය අනවසරයෙන් සටහන් කලේ ය.

" අයි ලව් යූ මන්දු අයිම් රියලි ඉන් ලව් විත් යූ" සියුම් කෙදිරිල්ලක ස්වරයෙන් එම වදන් පැවසූ රන්දිව් නැවත තම රථයේ නැඟ පිටව ගියේ ය.

සිදු වූ කිසිවක් අදහා ගත නොහැකි ව තවමත් හුන් තැනම සිටි ඈ එක්වරම ගෙ තුලට දිව්වේ ලැජ්ජාවෙනි ඉදිමූ කම්මුල් පෙති දෑතින් ම වසා ගෙන.

ඇය සිටියේ පුදුමයෙනි.ඇය සිතූ ලෙස ම රන්දිව් ගේ ආදරය ඇය සොයා පැමිණෙද්දී මේ කිසිවක් වටහා ගත නොහැකිව ඈ එම සයුරේ අතරමං විය.මන්දු සැබැවින් ම ඒ හුස්ම පොඳට ප්‍රිය කලා ය. ඇය එම ආදරයට ඇබ්බැහි විය.නමුත් ඇයව වළකාලන බියක් ඈ සිත තුල සක්මන් කලේ ය. තමා රන්දිව් ට පෙම් කරන වග පිලිගැනීමට ඇය බිය වුවා ය.මේ සිදුවීම් සියල්ල තරූ ට පැවසීමට අවැසි වුවා ත් මෙය එයට සුදුසු වෙලාව නොවන බව ඈ වටහා ගත්තා ය.

පසු දින උදෑසනින් ම නැඟිට තම ගමට යෑමට ඇය තීරණය කලා ය. බදුල්ල බස් රථයේ නැඟ ඇය දහවල වන විට තම නිවස වෙත ලඟා විය. ගේට්ටුව අසලටම වී රැඳී සිටින මව දැක මන්දු ට ඇති වූයේ අපරිමිත සොම්නසකි.ඇය දිව ගොස් රෝශිනී ව වැළඳ ගද්දී වසන්තත් එතැනට පැමිණයේ ය.

" කොහොමද පුතේ...." වසන්ත දයාබරව ඇගේ හිස සිඹිද්දී මන්දු ඇසට ඉනුවේ සතුටු කඳුලකි.

මන්දු නිවසට ඇතුළු වන විට වෙනද තරම් සැනසිලිදායක නොවීය. ඇගේ මුලු නිවසම කාර්‍යබහුල ස්වභාවයක් අරක් ගෙන ඇත.ලොකු නිවසේ නොසිටියේ ඔහු මේ වනවිටද තම විවාහයේ කාර්‍යයකට බැහැර වී ඇති හෙයිනි.
මන්දු තම කාමරයෙහි සියලු මලු අතුරා නාන කාමරයට වැඳුනේ විඩාව නිවා ගැනීමට ය.මඳ වේලාවක් එහි රැඳුනු ඇය තුවාය ඇඟ ලා ගෙනම කාමරයට පැමිණියා ය.

" තරූ උබ.." මන්දු දුවවිත් ඇයව වැලඳ ගත්තා ය.

" ඊයේ උඹ කිව්වනේ එනවා කියලා. ඒකයි ආවේ බලන්න" තරූ ත් සිනාසෙමින් ඇයව වැලඳ ගත්තා ය.

" මේ බන් දැන් අම්මට කොහොමද " මන්දු විමසුවේ තරූ ගේ මවගේ අසනීප තත්වයයි.

" දැන් ගොඩක් දුරට හොඳයි බන්.එදා මං එනකොටත් අයියා අම්මව හොස්පිටල් එක්ක ගිහින් පස්සේ ඩොක්ටර් බෙහෙත් දීලා දැන් ශේප්" එම පිලිතුර මන්දු ට එක් කලේ සැහැල්ලුවකි.

" ඉතින් මොකෝ වුණේ මං නැති දවස් දෙකේ.එනිතිං ස්පෙශල්?" තරූ විමසද්දී මන්දුට සිහිවූයේ ඒ විශේෂ සිදුවීමයි.ඇගේ ප්‍රේමය... තරූ ට සයාශ් පිළිබඳ මන්දු ට පැවසීමට බාධා වූ ඒ බියම මෙවර මන්දු අභියසයි.ඇය තරූ ට කිසිවක් නොකියා සිටීමට තීරණය කලේ මේ එයට සුදුසු වේලාව නොවන බැවිනි.

" මොන ස්පෙශල් ද බන්.මං කට්ට තනියම හිටියේ මාර පාලුවෙන්.උබ ගියාට පස්සේ අපේ අයියලා ආවා බඩු ගන්න." මන්දු රන්දිව් ගේ සිදුවීම හැර අනික් සිදුවීම් සියල්ල තරූ ට පවසා සිටියා ය.

දෙදෙනාම හවස් වනතුරු  අල්ලප සල්ලාපයේ යෙදෙමින් සිටියේ කාලය ගැන නොසිතමින් ය.පසුව තරූ ඇගේ නිවසට යෑමට තීරණය කලේ මේ වනවිටත් යාන්තමින් කලුවර වැටී ගෙන එන නිසාවෙනි.

සියලු දෙනාම ලහි ලහියේ සූදානම් වූයේ ලොකුගේ විවාහ මංගල්‍යයටයි.මන්දු දහවල් ආහාරය අනුභවයෙන් පසු තම නිදන කාමරයට ගියේ ජංගමයට මඳ අවධානයක් ලබා දීමටයි.ඇය ජංගමය විවර කොට එහි ගැලරිය වෙත ගියේ ය.අයියා නමින් ඇති ෆෝල්ඩරය විවෘත කර එහි වූ ලොකු ගේ ඡායාරූප එකින් එක ඈ බැලුවේ සතුටු කඳුලු අතරින් ය.

" ඇත්තටම ලොකු මාර කෙනෙක්. එයා ශෙනායා අක්කාට කොච්චර ආදරෙයි ද... " සිතිවිලි ලොකුගේ නමට වූවත් හඬේ දොරටුව විවර වූයේ රන්දිව් දෙසටයි.

" ප්ලීස් වැඩිය කල් ගන්න එපා.ඔයා මට කැමති නම් කෙලින් කියන්න." රන්දිව් ගේ මෙවදන් සිහිව මන්දු නැවත් ගිලුනේ හැඟීම් සාගරයකය.

" මං ඔයාට කැමති අයියේ ඒත් මට ....තේරෙන්නේ නෑ ඒක කියන්න.." මන්දු තම සිතිවිලි සමඟම පොර බැන්දේ ඇයටද නොතේරෙන මේ හැඟීම ඇයට අසීමිත ලෙස වද දෙන බැවිනි.නොදැනීම ඇයට නින්ද ලඟා වූයේ කායිබහුල වූ ගතත් සිතත් විඩාබර නිසාවෙනි.

හෝරා කිහිපයක් ගත වෙද්දී රන්දිව් මන්දුගේ නිවසට ලඟා විය.තෑගි බෝග රැසක් සමඟ රන්දිව් ගේ තුළට ගොඩ වෙද්දී ඒ දෑස් සෙව්වේ ඒ හුරතලීවයි.

" අයියෝ මේවා මොනවටද පුතා ,...පුතා වාඩිවෙන්න මං තේ එකක් හදන් එන්නම්. ඔන්න අයියාත් වෙඩින් හෝල් එකට ගියා මාමා එක්ක .කොහෙද තව ඉවර නෑනේ වැඩ.." රෝශිනී රන්දිව් එසේ පිළිගනිද්දී රන්දිව් සෙව්වේ ඔහුගේ සිත තුල

නැඟෙන පැනයට පිලිතුරයි.එය ඇගෙන් නොලැබෙද්දී ඔහුම ඒ පැනය රෝශිනීට යොමු කලා ය.

"එව්වා එහෙම තමා නැන්දේ.වෙඩින් එකක් ගන්න එක ලේසි නෑනේ .නැන්දේ මන්දු නැද්ද මං දැක්කෙවත් නැනේ"

" අන්න කාමරයට ගියා පුතේ. හැබැයි දැන් පැය දෙක තුනක් වෙනවා.නිදිද දන්නේ නෑ. පුතා උඩට යන්න අයියලත් දැන් මඟ ඇති." ඒ ලද අවසරය රන්දිව් ට ඉස්තරම් ය.රෝශිනී කුස්සියට යනතෙක් ඉඳ ඔහු සෙමෙන් සක්මන් කලේ මන්දුගේ කාමරයටයි.

ඇඳ විට්ටම මත කොට්ටය තබා ගෙන නිදා සිටින ඒ රුව දෙස බලා සිටි රන්දිව් සෙමෙන් ඇයට කතා කලේ ය.

" මන්දු ...."

" හ්ම්......"සියුම් කෙඳිරිල්ලක ස්වරයෙන් ඈ ඔහු දෙසට හැරුනා ය.

" රන්දිව් අයියේ ඔයා නම්, පුදුම වදයක් මට දෙන්නේ.එපාර දැන් මට ඔයාව හීනෙනුත් පේනවා..." පුංචි කිරිල්ලියක මෙන් කියවගෙන යන ඒ නිදි කුමාරිගේ අත රන්දිව් සෙමෙන් පිරිමැද්දේ සිනා රැලක් ඇයට පා කරමිනි. කිසිවක් නොදන්නා මේ නිදි කුමාරියට ඇයට හිමි ඒ නින්ද ලබා දීමට ඉඩ දෙමින් රන්දිව් කාමරයෙන් පිටවිය.

" නංගි ...මන්දු නැඟිටිනවා.." ලොකුගේ හඬට තිගැස්සී අවදි වූ මන්දු වටපිට බැලුවේ සිදුවූ කිසිවක් වටහා ගත

නොහැකිවයි. රන්දිව් ගේ රුවත් ඒ කටහඬත් ඇයට සිහිනයෙන් මෙන් දැනුනා ය.

" මේ අර රන්දිව් මල්ලි ඇවිල්ලා. පහළට එන්න මූණ හෝදගෙන " ලොකු පවසා අවසානයෙයි ඇය තේරුම් ගත්තේ මේ කිසිවක් සිහිනයක් නොවන බව. ඇය පැවසූ දේවල් මොනවාද යන්න මතක් කරලීමට ඇය කෙතරම් උත්සහ දැරුවත් මොළය විසින් ඒවා සටහන් නොකර ගෙන ඇතැයි ඇයට සිතිණි.

දින ගෙවී ගියේ වේගයෙනි.අද දිනට නියමිතව තිබූ ලොකුගේ විවාහය හේතුවෙන් සියල්ලන් ම සිටියේ කාර්යබහුලවය.මන්දු සිටියේ සූදානම් වෙමිනි. ජීවිතයේ පළමුවරට ඇය සාරියකින් හැඩ වුණි.තද නිල් පාට සමඟ ලා රෝස වර්ණය මිශ්‍ර වීමෙන් නිර්මාණය වී තිබුණු ඒ සාරිය සැබැවින් ම ඇයට ගෙන ආවේ චාම් සුන්දරත්වයකි.ඇය එයට ගැලපෙන තොල් ආලේපනයද තෝරාගෙන කැඩපතින් දිස්වෙන ඇගේ සුන්දරත්වය දෙස බලා සිටියා ය.මන්දුගේ සිතුවිලි පෙරදින රාත්‍රිය වෙත ඇදී ගියා ය.

මන්දු ඇගේ කාමරයේ සිට ඇඳුම් සකස් කරමින් සිටියා ය.ඇයට සිහි වූයේ ලොකුවයි.ඇය ඇඳ මත වාඩි වී හෙට දිනය ගැන කල්පනා කලේ අවසානයේ ඔහුගේ ත් ශෙනායා අක්කාගෙත් විවාහය සිදුවන බව සිතමිනි.ලොකු ශෙනායා අක්කා සමඟ ඇගේ නිවසේ පදිංචියට යෑමට තීරණය කලේ ඇගේ මව එහි තනි වන බැවිනි.මන්දු දීර්ඝ සුසුමක් හෙලුවේ ඇයට ඇති වන පාලුව ගැන සිතමින් ය.ඇඳ මතින් ඉක්මනින් නැඟිට ගත් ඈ පිය මැන්නේ ලොකු සොයාගෙනය.ලොකු ඔහු ගේ කාමරයෙ සිට කවුරුන් සමඟ හෝ ඇමතුමක සිටී.

මන්දු එම දොරට තට්ටු කලේ ප්‍රථම වතාවටයි.

" අයියේ මං එන්නද..." ඇය හෙමිහිට කතා කලා ය.

" මොකද බං මේ අලුත් එකක් පටන් අරගෙන.කවදාවත් නැතුව දොරට තට්ටු කරන්න" මන්දුල් විමසුවේ පුදුමයෙනි.

" නෑ ඉතින් දැන් ඉස්සර වගේ ඩෝං ගාලා කඩාපාත් වෙන්න බෑනේ.ඉස්සරහට අක්කාත් එක්කනේ ඉන්නේ ඒ නිසා මේක පොඩි පෙර පුහුණුවක් " විහිලුවෙන් වුවද ඇය එය සිදු කලේ සිතාමතාමය.

" ඒක හොඳයි...ඇයි දැන් ආවේ" ලොකු පැවසුවේ ජංගමය දෙස බලමිනි.

" මේ ...අයියේ මට ඔයා නැතුව පාලුයි අයියේ ....." හිත යට සැඟවී තිබුණු ඒ හීනී කඳුලු කැට ඉකිගසමින් ලොකුගේ පපුවට දැනෙද්දී මන්දු ඔහුව තදින් බදාගත්තේ ඇගේ පාලුවෙහි තරම ඔහු ට පෙන්වීමට ය.

" ඕයි..නංගි ...." ලොකු ඇයට බාධා නොකර ඒ කඳුලු වලට ඔහේ ගැලීමට ඉඩ දුන්නේ ය.විනාඩි කීපයක් ගත වෙත්ම ඇගේ හැඬීම ක්‍රමයෙන් අඩු විය.ලොකු ඇයව ඇඳ මත් ඉන්දවා ඇයටත් ඔහුටත් බත් පිඟානක් ගෙන ආවේ ය.ඔහු කිසිවක් නොකියා ඇගේ කම්මුල් දිගේ බේරෙන ඒ කඳුලු පිස දමා පුටුවක් ගෙන වාඩි විය.

" මන්දු .... මං තමුසෙගේ ලොකු ... මං හෙට ශෙනායාව මැරි කලා කියලා ඒක වෙනස් වෙන්නෙ නෑ.ඔයත් එක්ක එදා

රණ්ඩු කලා වගේම මට පුලුවන් හෙටත් රණ්ඩු කරන්න.ඔයත් එක්ක එදා ගහගත්තා වගේම මට පුලුවන් හෙටත් ගහගන්න.ඔයාට එදා විහිලු කලා වගේම මට පුලුවන් හෙටත් විහිලු කරන්න.වෙනස් වෙන්නේ මං ඉන්න තැන විතරයි.නැතුව මං ඔයාගෙ අයියාකමෙන් නැති වෙන්නේ නෑ.ඒ වගේම තමුසේ ට මං පාලු හිතෙන්න ඉඩ තියන්නෙත් නෑ.මං ඔයා ළඟ හැමදාම හැමදේකටම ඉන්නවා" ඒ ආදරණීය වදන් අවසානයේ ලොකු ඔහුගේ සහෝදර ප්‍රේමය මන්දුගේ නලළ මත තැබුවේ සියුම් සිපුමකින් ය.

ලොකු රැගෙන ආ බත් පිඟාන අතට ගෙන  මන්දු ට කැව්වේ ආදරයෙනි.මන්දු ට සිහි වූයේ ඇගේ කුඩා කලයි.එකල ද ලොකුගේ මෙම පුරුද්ද ඈ සැම විටම දුටුවා ය.නමුත් අද ඔහුගේ මෙම පුරුද්දෙහි ගැබ් ව ඇත්තේ ආදරය පමණි.ඇයට සැබැවින් ම ලොකු ගැන දැඩි ආදරයක් දැනුනි.ලොකු වගේ කෙනෙකුන් හිමි කරගැනීමට සත්‍ය වාසනාවන්තිය ශෙනායා අක්කා වීම ගැන මන්දු තවදුරටත් කල්පනා කලේ සැනසිල්ලෙනි.ලොකු බත් පිඟානම මන්දු ට කවා අවසානයේ ඇය අසලින් වාඩි විය.

" ඉතිං අද කොහොමද මං මගෙ නංගිගේ පාලුව නැති කරන්න ඕනේ..ම්ම්" මන්දුල් මන්දුගේ හිස අත ගාමින් ඇසුවේ ය.

" මට අද ඔයාගෙ ළඟින් ඉන්න ඕනේ ....අයියේ " මන්දු ඒ සිරුරේ තුරුළු වෙමින් පැවසුවා ය.

" හ්ම් එහෙනම් එන්න අද මගේ ළඟින් නිදා ගන්න...පොඩි

බබාට එන්න කතන්දරයක් කියලා දෙන්න."මන්දුල් සිනාසෙමින් ඇයව ඇඳ මත හාන්සි කරවා ඇයට කුඩා දරුවෙකුට මෙන් කතන්දරයක් ද කිව්වේ ය.මන්දු ඇගේ හිස මත දිව යන ඒ සියුම් රළු ඇඟිලි පහස විඳිමින් ම නින්දට වැටී ය.

" මං උබට ගොඩාක් ආදරෙයි නංගි.ගුඩ් නයිට්" ලොකු මන්දුගේ නලළේ නැවත ඒ සහෝදර ප්‍රේමය උතුරන හාදුව තැන්පත් කලේ ය.

" අම්මටසිරි මන්දුවෝ උබේ ලස්සන ..." මන්දු සිහියට ආවේ තරූ ගේ ටකරං වොයිස් එක කන් පුරා රැව් පිලි රැව් දෙද්දීයි.

" තරූ මේක දාන්නද එපාද" මන්දු විමසුවේ ඇගේ සාරියට ගැලපෙන සරල මෝස්තරයකින් හෙබි වළල්ලක් තරූ වෙත පාමිනි.

"ඕවා නම් ඕනෙත් නෑ බන්. අද නම් උබේ ලස්සනට අයිතිකාරයෙක් හම්බෙයිද දන්නේ නෑ මේ වෙඩිමෙදී. ලොක්කයියගේ යාළුවෙක්වත් සෙට් වෙයිද කියන්න කවුද දන්නේ." තරූ විහිලුවට මෙන් පැවසුවා ය.

" අනේ බං මේ මඟුලක් කියවන්න එපා." මන්දුට සිහි වූයේ රන්දිව්ය.ඔහුගේ ප්‍රතිචාරය දැක ගැනීමේ කුතුහලයක් මන්දුට ඇති විය.

පෙරවරුවේ ලොකුගේ ද ශෙනායා අක්කාගේද පෝරුවේ චාරිත්‍ර අවසන් විය.දැන් සැබැවින් ම ඔවුන් සැමියා සහ බිරිඳයි.නමුත් තවමත් ඇයට ඒ රුව නොපෙනුනි.ඈ සෙවූ රුව

නොපෙනුණි.තරූ සිටියේ මන්දුගේ මෙම හැසිරීම ගැන සැලකිල්ලෙනි.මන්දු කිහිපවතාවක් ම ශාලාවෙන් පිටත් ව ගොස් පැමිණියේ පරාජිත මුහුණෙනි.තරූ මේ සියල්ල ඉවසා බලා සිටියේ අවසාන නිගමනයකට එළැඹීමකට පෙරය.

" මන්දු ...මොකො බං" තරූ ඈ අසලින් හිඳ ගනිමින් ඇසුවා ය.

" මුකුත් නෑ බං".

" උඹට හිතෙන්නේ නැද්ද උඹට මට මොනා හරි කියන්න අමතක වුණා කියලා.."

" ඒ මොනාද .." මන්දු විමසුවේ ඇස් හීනි කරමිනි.

" රන්දිව් අයියා ගැන...." තරූ ඇගේ සැකය මන්දුට වැටහීමට සැලැස්වී ය.

" මොකා..ද්ද.ඇයි එයා..ගැන." මන්දු සිටියේ පුදුමයෙනි.ඈට කිසිවක් වැටහී ගියේ නැත.

" උඹ හිතුවද මං ඔටුවෙක් කියලා.මට මුල ඉඳන් උඹලා දෙන්නගේ පෙනුනේ යාළුකමක්වත් සහෝදරකමක්වත් නෙමෙ.ස්පෙශලි අපේ අයියාගේ " තරූ මවා ගත් තරහවකින් මන්දුට බැන වැදුනේ ඇගේ ප්‍රතිචාර බැලීමටයි.

" අනේ බං එහෙම එකක් නෙමෙ.ඇත්තටම රන්දිව් අයියා මට යාළුවෙක් වගේ එච්චරයි "

" එහෙම එකක් නෙමෙ නම් කොහොම එකක්ද" තරූගේ

ප්‍රශ්න තවදුරටත් මන්දු ට දරා ගත නොහැකි විය.ඇය සිදු වූ සියල්ල වැමෑරුවේ ය.රන්දිව් ගේ යෝජනාව ගැන පවසත් ම තරූ ගේ දෑස් නලළ දෙසට දිව ගියේ වේගයෙනි.

" යකෝ අපේ එකා මාර එකෙක් නේ" මන්දු දෑස් බිමට හරවා ගත්තේ ලැජ්ජාවෙනි.

" දැන් උබ මොකෝ ඇඹරෙන්නේ. මෝඩි.හරි දැන් මට කියපන්කෝ උබ රන්දිව් අයියාට කැමති ද නැද්ද " තරූ මන්දුගෙන් විමසුවේ කෙලින්මය.මන්දු මඳ නිශ්ශබ්දතාවයකින් අනතුරුව පිලිතුරු දුන්නා ය.

" නෑ කියන්න බෑ බං .ඒත් මට අමුතු බයක් දැනෙනවා.මං ගැනම.එක වෙලාවකට මේක වැරදියි කියලා හිතෙනවා.මට ඕනේ නිදහසේ ඒක එයාට කියන්න.ඒත් මම තාම ඒක පිලිගන්න රෙඩී නෑ බං ඒකයි මට බය" මන්දු ඇගේ සිතිවිලිවල අවංකභාවයෙන් ම පැවසුවා ය.

" මන්දුවෝ මේ අහපන්... උබම තමා මට කිව්වේ ආදරය කියන එක අපිට ඕනෙ වෙලාවට ඇතිවන දෙයක් නෙමෙ කියලා.ඒක හරියට හුස්ම වගේ කියලා.උබට මේ වෙලාවේ හරි කියලා හිතෙන දේ තියෙනවා නේද ඒක මොලෙන් හිතලා හදවතින් කරන්න.උබට උබේ ආදරය ගැන විශ්වාසයක් ආවාම අපේ අයියට ගිහින් කියන්න.සමහර විට උබේ තීරණය වෙනස් වෙන්නත් පුලුවන්.මටවිශ්වාසයි එයා ඒක තේරුම් ගනියි. හරිද දැන් අපි යමු ඇතුළට කට්ටියම බලන් ඉන්නවා" තරූ මන්දුවත් කැඳවා ගෙන ඇතුළට යත්ම ඒ සිව් ඇස් යුග ගැටිණි.තරූ ශෙනාය අක්කා වෙත යද්දී මන්දු හුන් තැනම සිටගෙන සිටියා ය.ඔහුගේ උපන්දිනයට ඇය ලබා දුන්

කමිසය නියමම ප්‍රමාණයෙන් ඔහුට සරිලද්දී ඒ කමිසයට උඩින් දමා තිබුණු කෝට් එක රන්දිව්ට ගෙනාවේ පිරිපුන් කඩවසම්බවකි. රන්දිවි ද ඒ රූපශොබාවට වශී වී සිටියේ නෙත් අඳහා ගත නොහැකිවයි.ඔහු ඇය වෙත ආවේ ය.

" ඔයා අද ලස්සනයි..." රන්දිවි සියුම්ව ඒ වත නිරීක්ෂණය කලේ ය.

"ඔයත්.." මන්දු ද ඒ කඩවසම් රුව ඇගයීයා ය.පසුව ඔවුන් කතා කලේ ලොකු පිළිබඳවයි.තම සොයුරා ගැන ආදරණීය වදන් තෙපලන ඇය දෙස රන්දිවි බල සිටියේ සතුටින් ය.

" මන්දු ....ඉතිං ඔයා කවදද මට කැමතියි කියන්නේ...ම්ම්ම් " රන්දිවි එක්වරම ගැඹුරු ස්වරයකින් විමසුවේ මන්දු ගේ සාමාන්‍ය හද ගැස්ම අසාමාන්‍ය කරමිනි. ඇය නිහඬ විය.නෙතු බිමට හරවා ගෙන දෑස් පියා ගත්තා ය.

" මන්දුවෝ නැඟිටපන් වරෙන් රිසාල්ට්ස් බලන්න " ලොකුගේත් ශෙනායා අක්කාගෙත් විවාහය සිදුවී සතියක් ගෙවිණි.එදින රන්දිවිගේ පැනයෙන් පසු මන්දුව තරූ ඇදගෙන ගියේ නැටුම් වේදිකාවටයි.ඇයට එවරද ඒ සිතිවිලි කියා ගන්නනට නොහැකි විය.මේ සිදුවීම සිහිනයක් වී ඈට පෙනෙද්දී එදින මෙන් අදද බාධාව තරූගෙනි.

" බං මට නම් බයයි.අනේ උබම එන්ටර් කරපන්" තරූ සිටියේ බියෙනි.මේ රාත්‍රිය ඔවුන්ගේ ජීවිත අලුත් කරයි.පෙර දින කල දැනුම්දීමකට අනුව අද දින ප්‍රතිඵල නිකුත් වීය.තරූ ද මන්දුගේ නිවසේ අද රාත්‍රිය ගතකිරීමට සිතුවේ එබැවිනි.

" හිටපන් බලන්න...ආහ් මේ තියෙන්නේ ....බං මේ මොකක්ද අපි කරගෙන තියෙන්නේ ...අයියෝ..." මන්දු එක්වරම ඔළුවට අත ගසාගෙනම ඇඳට වැටීය.

" ඇයි...අනේ...බං ...කෝ මෙහෙට දියන් බලන්න..." තරූ මන්දුගෙන් පරිගණකය උදුරා ගත්තා ය.

" බං ....පාස් යකෝ...ඒකත් උඩින්ම ...තෝ නම්...යකෝ ඒ බයකරපු විදියට පලවෙනියටම උබට කරන්න වෙන්නෙ මගේ හර්ට් සර්ජරි එකතමා...මේ එන්න යං අම්මලට කියමු."

"දැන් ..?" මන්දු බැලුවේ ඔරලෝසුව දෙසයි.එහි දිස් වූයේ 1.24 ලෙසිනි.

" ඔව් යමං මට නම් දැන් නිදා ගන්න බෑ" තරූ එසේ පවසමින් ම කාමරයෙන් එළියට ගියේ නිදා වුන් සියලු දෙනාම අවදි කරන්නටයි.අවසානයේ දෙදෙනාම නතර වූයේ ලොකුගේ කාමරයට අසලයි.ශෙනායගේ නිවසට යෑමට පෙර ලොකු පැවසුවේ ඔවුන් ටික කාලයක් මෙහි රැඳීමට කැමති බවයි.

" බං අයියලගේ පැණි හදේ එක නේද මොනවා කරනවද දන්නේ ඕනේ නෑ නේද" මන්දු ට එක්වරම සිහිවූයෙන් ඇය තරූ ට පැවසුවා ය.

" මොන පැණිද බං ඔන්න ඔහේ නැඟිට්ටවන්න.කොහොමත් රිසාල්ට්ස් කිව්වාම අපිව හඳට යවයි."

" හ්ආහ් ....ඇයි..බං වද දෙන්නේ" ලොකු නිදි ගැට කඩමින් ම දොර විවර කලේ ය.

"හරි දැන් කට්ටිය ම ආවානේ...ඔන්න එහෙනම් වසරේ දැවැන්තම රාත්‍රිය අදයි....." මන්දු සියලු දෙනාම සාලයට රැස් කරවා තරූ ට ආරම්භය ලබා දුනි....

" ටෑන් ටටට ටට් ටට් ටට් ටට් ටා....... අද දිනයේ සිට මන්දෝදරී තිසාක්‍යා සළුවඩන වන මාගේත් මාගේ අතිජාත කට හැකර මිතුරිය තරුනි හෙවත් තරූගේ ත් නම් ඉදිරියට dr. එකතු වෙයි.එබැවින් ඒ ගරු නාම ලබාදී අප අමතන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.." මන්දු හෙනම ආඩම්බරයකින් එසේ පැවසුවා ය.

" පුහ්...මැස්සියෙක් ගිය උඩ..." ලොකු සරදම් ස්වරයකින් පැවසුවේ ය.

" අයියේ මැස්සෝ කොහොමත් යන්නේ උඩින් තමා " තරූත් එකට එක ය.

" අනේ මගේ කෙල්ලෝ දෙන්නට රත්නත්‍රයේ පිහිටයි .." රෝශිනී දෙදෙනාම ආදරයෙන් සිඹ හිස අත ගෑවා ය.

" මේක කියන්නද දැන් අපිව නැඟිට්ටෙව්වේ මෙන්න මෙහෙ යන් ශෙනායා අපි ..." මන්දුල් ඔවුන් ව ඇවිස්සීමට මෙන් පැවසුවේ ය.

" යකෝ මූ බලහන්කො" මන්දු ත් තරූ ත් දෙදෙනාම සිනාසී ය.

පසුදින මන්දුත් තරූ ත් ටවුමට ගියේ අත්‍යවශ්‍ය බඩු කිහිපයක් මිලදී ගැනීමටය.එක්වරම මන්දුගේ ජංගමය උඩ පැන්නේ නාඳුනන අංකයක් සටහන් කරමිනි.

" යෙස්....ඕහ් තැන්ක් යූ සෝ මච් සර් ..... යා අයි විල් තැන්ක් යූ සෝ මච් සර් ඉට්ස් මයි ඩ්‍රීම්..." මන්දු සුභ ආරංචියක හෝඩුවාවක් සටහන් කරන සිනහවකින් දුරකථන ඇමතුම විසන්ධි කලා ය.

" මොකෝ බං.." විමසිල්ලෙන් තරූ ඇසුවා.

මන්දු ඇයට එම මොහොතේ කිසිවක් නොකියා නිවසට යෑමට පිටත් වුණි.නිවසට පැමිණි විගසම රන්දිව් ට කෙටි පණිවිඩයක් එක් කල ඈ ලොකුට ඇමතුමක් ගත්තා ය.

" අයියා....මට අද කෝල් එකක් ආවා.... හ්ම් ඔව් එයාලා කතා කලා....අනේ මන්දා ...මට දැන් නම් බයයි වගේ...හ්ම්..." මන්දු ඇමතුම අවසානයේ ඇඳ මත වාඩි විය.

(බීප් බීප්) .....

" හ්ම්...හෙට මීට් වෙමු ද...😊" මන්දු ට පැමිණියේ රන්දිව් ගේ කෙටි පණිවිඩයයි.

මන්දු දිගු සුසුමක් වාතයේ පා කලාය.අවසානයේ ඈ රන්දිව් ව හමුවීමට තීරණය කලා ය.

" හා... queen's එක ළඟට එන්නම්🙂"

මන්දු පසු දින රන්දිව් හමුවට ගියා ය.ඇය සිටියේ සිතිවිලි ගොන්නක අතරමංවයි.රන්දිව් ද ඇයද අවන්හලකට ගියේ කෙටි ආහාරයක් ගැනීම සඳහාය . රන්දිව් ඇයට ද ඔහුටද ආහාර ඇණවුම් කලේ ය.

" ඉතින් කොහොමද මන්දු .....මේ දවස් ටිකේම අර ප්‍රොජෙක්ට් එකේ වැඩත් එක්ක ෆුල් පැක් වෙලා හිටියේ ඊයේ ඒක ඉවර කලා දැන් නම් මාඅ සැනසීමක් තියෙන්නේ..." රන්දිව් ඉමක් කොනක් නැතිවම කියවාගෙන ගියේ ය.

" මම හොඳින් අයියේ.....මෙ..අයියේ මට ඔයාට දෙයක් කියන්න තියෙනවා ....." මන්දු අවසානයේ එය පැවසීමට තීරණය කලා ය.

රන්දිව් ගේ ඇස් නලලට දිව ගියේ ය.ඔහු ආසාවෙන ඇගෙන් ඇසීමට සිටි දෙයද ඇය පවසන්නට යන්නෙ.....

" ඔව්....මන්දු.. ක්..කියන්න..."

" අයියේ මං .....මේ මං.. රට යනවා..." මන්දු අවසානයේ දැඩි සිතකින්ම එය පැවසුවා ය.

" මොකාක්....ඒ ...ඒ කියන්නේ ආයේ එන්නෙ නැද්ද.." රන්දිව් ගේ සිත බිඳුණු බව සැබෑ ය.එහෙත් ඔහු එය ඇයට පෙන්වූයේ නැත.

" නෑ.....ටික කාලයකට විතරයි.." මන්දු ඒ දෑස් දෙස බැලුවේ හොරෙනි.

රන්දිව් එතැන් සිට බර කල්පනාවකට වැටුනි.

" එයා තරහින්ද ඉන්නෙ මං කතා කරනවද..." රන්දිව් ගේ හැසිරීම මන්දු ට එක් කලේ බියකි.

" රන්දිවි ...."

" අපි යං මන්දු ...." එක්වරම ඔහු නැඟිට ගත්තේ පිටවීමට ය. නිවසට පැමිණෙන තෙක් ම දෙදෙනා ඔවුන්ගේ ලෝකවලය.මන්දු ට අවැසි වූයේ රන්දිවිගේ සිත සැදීමටය ..නමුත් ඇයව නවතාලන කුමක් හෝ දෙයක් ඇගේ සිත තුල වීය.රන්දිවි ද සිටියේ සිතිවිලි ගොන්නකය.තමාගේ පෙම්වතියගේ මේ වෙන්වීම ඔහුට එක් කලේ ගැඹුරු දුකකි.

" මන්දු ගෙදරට ආවා.මට මහන්සියි මං යන්නම්.ඔයාව එදාට එයාපෝර්ට් එකට ඩ්‍රොප් කරන්න මං එන්නම්."

රන්දිවිගෙන් ඇය බලාපොරොත්තු වූයේ තරහෙන් ඇයට බැන යන්න එපා යැයි කියන තරුණයෙකුයි.නමුත් කිසිවක් ම නොකියා අඩුම තරමේ බැල්මක්වත් නොහෙලූ ඔහු නික්ම ගියේ මන්දු ව වඩාත් අපහසුතාවයකට පත් කරමිනි.

නිවැසියන් සමඟ ගත කරන මේ අවසන් දින කීපයම මන්දු සිටියේ පුදුමාකාර සැහැල්ලුවකිනි.රන්දිවි ට කෙටි පණිවිඩ කිහිපයක් ම යොමු කලද ඈට එයින් පිලිතුරු ලැබුනේ නැත.ඉතින් අවසානයේ ඇය විදේශ ගත වන දිනය උදා විය.ගුවන්තොටුපලින් සමු ගැනීමට ප්‍රථමව ඇය වසන්තටත් රෝශිනීටත් දණ නමා ඒ පා සිප ගත්තා ය.

" මගේ පුතාට තෙරුවන් සරණයි....පරිස්සමින් ඉන්න පුතේ..." වසන්ත ආදරයෙන් මන්දු ගේ නලලත සිම්බේය .

" අනේ පුතේ හොඳට කෑම ටික කන්න නොවරදවා ම.අනේ හැමදාම කතා කරන්න පුතේ...වැඩිය මහන්සි වෙන්න එපා

එහේ සීතලයිනෙ පුතේ.ජැකට් එක දාගෙනම ඉන්න ගලවන්න එපා..." රෝශිනී සුපුරුදු මවකගේ වදන් වලින් ඇගේ කන් පිරෙව්වා ය.

" හරි අම්මා...හරියට බෙහෙත් ටික බොන්න අප්පච්චි ඔයාත් මං එලාම් එක සෙට් කලා ....හරි ද..."

" බය වෙන්න එපා මං අම්මලව බලා ගන්නම් ඔයා පරිස්සමින් යන්න නංගි ගිහින් කෝල් කරන්න..හරිද" ලොකු ඇගේ නලලත ආදරණීය සොයුරෙකු මෙන් සිම්බේය . මන්දු ඔහුටද දණ නමා වැන්දා ය.ඇය ඒ බාහු තුරුලේ මඳක් සිටියේ ඇයට ඇතිවන පාලුවේ ස්වභාවය තේරුම් කරමිනි.

" පරිස්සමින් ඉන්න අක්කා...මං ආයෙ එනකොට මට නැන්දා පට්ටම දෙන්න ලෑස්ති කරලා තියන්න.මේ බන්ඩියට පුංචි චැම්පියන් කෙනෙක් ව ගෙනල්ලා...හරිද...ආදරෙයි ගොඩාක්.." මන්දු සිනහවෙන්ම ශෙනායව වැලඳ ගත්තේ ඇයට වැඳීමෙන් අනතුරුවයි.

" පරිස්සමින් පලයං බම්...උබ නැතුව පාලු හිතෙයි...මට ගන්න හැමදාම .....ආදරෙයි උබටමං හරිද....." තරූ වචන අවසානයේ කඳුලුව තරූ උරහිස් තෙමුවේ ය.

" ඒයි .....ඇලුමිනියම් බලු වැඳිරියේ උබ අඬනවා ද.ඩොක්ටර්ස්ලා මෙහෙම අඬනවද ....මං උබට කොහොමත් ගන්නවා ඇයි යකෝ.....පරිස්සමින් හිටපන් මං එනකං හදිස්සි වෙලා ....මං ආවාහම මගේ අතට ලමයෙක් එහෙම දෙන්න එපා හොඳේ..." සැවොම සිනා සාගරයේ ගිල්වමින් මන්දු තරූ ව තදින් වැලඳ ගත්තා ය.

සැමටම සමු දී ඇය ගමන් මලු පරීක්ෂණය වෙත ගියා ය.

" මන්දු ....." ඈත සිට හතිලමින් එන රන්දිව් ව ඈ දුටුවා ය.

" රන්දිව් ඔයා...."

" සොරි මං පරක්කු වුණා ....."

" නෑ අයියේ ඔයා දැන් හරි ආවානේ..."

"නංගි ඔයාගේ මේ ගමන සාර්ථක වෙන්න කියලා මං හදවතින්ම ප්‍රාර්ථනා කරනවා.මං දන්නවා එදා ඔයාට අවුල් ගියා කියලා මං සයිලන්ස් වුනාම.ඇත්තටම මං කලේ මගේ හිත හදාගන්න එක.මට බයයි මං නිසා ඔයාට ඔයාගේ ජීවිතේ වැරදෙයි කියලා.ඔයා තාම පොඩියි කියලමයි මට හිතෙන්නේ.ඉතින් නංගි....ඔයා ඔයාගේ ගමන පාඩුවේම යන්න.මං මෙතනින් නවතිනවා.අමාරු වෙයි ඔයා නැතිව ඔව් ගොඩාක් ඔයාගෙ හුරතල් වැඩ තමා මාව ඔයාට ලං කලේ.ඒත් අද .....නෑ ඔයා යන්න පරිස්සමින් මං ආදරෙයි මන්දු ....."

"රන්දිව් ....." රන්දිව් හරිම සිහියට පැමිනියේ මේ මොහොතේ ය.

" ආහ්...මෙ...මන්දු ඔයා පරිස්සමින් යන්න...මං ඔයාට විශ් කරනවා .all the best ....බායි..."

" එච්චර ද ඔයා ට කියන්න තියෙන්නේ..." සැබැවින්ම මන්දු සිටියේ පුදුමයෙනි.ඈ මීට වඩා ගැඹුරු ස්වරයක් රන්දිව්ගෙන්

බලාපොරොත්තු වූවා ය.

" හ්ම් ...ආ තව එකක්...ඔයාට අද දවස වෙනකන්ම ඉන්න වුනා නේද අර මගෙ නම අගට දාන විශේෂණ පදේ අයින් කරන්න...." රන්දිව් ගේ විහිලුවට මන්දු සිනහ නැගුනේ අයාසයකින් තොරවය.අවසානයේ ඇය රන්දිව් ට තම හදවතේ නාමයෙන් සමු දුන්නේ සිතිවිලි ගොන්නක රජ කෙරූ ඒ වැලඳ ගැනීම සනිටුහන් කරමිනි.

" මං දන්නේ නෑ රන්දිව් මං වැරදිද කියලා ඒත් මං දන්නවා මං තාම ඔයාගේ ආදරය පිලිගන්න ලෑස්ති නෑ කියලා..මට සමාවෙන්න මං ඔයාව අසරණ කෙරෙව්වා නම්.ඒත් මට වඩා ඔයාගේ ආදරය තේරුම් අරන් ඔයාට ඇත්තටම ආදරය කරන කෙනෙක් අනිවාර්යයෙන් ම ඔයාගෙ ළඟට එයි.එදාට ඔයා ලස්සන හිනා වෙයි.ඉතින් තැන්ක් යූ මාව තෝර ගත්තා ට.නමුත් ඒක වැරදි තේරීමක් වෙච්ච එකට තමා මට දුක..."

අවසානයේ මන්දු විදේශ ගත විය......

" අයියා මං දැන් ලැන්ඩ් කලේ...මාරම සීතලයි.....හ්ම්.... .ඔව්...හරි බුදුසරණයි." නැවුම් සීත දේශයක ආරම්භය මන්දු වින්දේ දීර්ඝ සුසුමක් හෙලමිනි.

"ඔහ් සොරි....." දැඩි දේහදාරි සිරුරකින් හෙබි තරුණයෙකු මන්දුගේ ගමන් මලුද පෙරලා ගෙන විත් ඇගේ ඇගේ හැපෙමින් කලබලයෙන් මෙන් දිව්වේ ය.

" අයියෝ ....බලනවා...ඉත්.." මන්දු ගල් ගැසුනි.
ඔව් ඒ.....එදින දුටු ඒ සුපුරුදු දෑසයි.නීල දෑස් හිමිකරුවා.දිගු

කඩා හැලෙන කොන්ඩය ඔහුට පෑවේ ඉස්තරම්ම කඩවසම් බවකි.......ඔහු ....ඔව් ඒ ඔහුමද?.

*නුඹ සුසුමක් මා ළඟ දැවටෙන*
*නුඹ කවියක් මට ගී රස මවන*
*නුඹ මහා සයුරක් මා නිවාලන*
*ඔව්......*
*නුඹ හුස්මක් මට මගේ නොවන*

*ඉතින් හමුවෙමු " හුස්ම 2 " තුලින්...........*

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිමණාකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළු) වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය සමයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදූහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ පුණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවළමයි. පොතකින් දරුවෙකුට ලැබෙන. ආදය අන් කිසිවකින්වත් ආකාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙමෙ ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය

යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණයේ සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න
මහලේකම්

***************

ISBN 978-624-208-760-3